# 2 පරිච්ඡේදය

# මහ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනය


## සාරාංශය

2023 වසරේ සැප්තැම්බර් මාසයේ සිට බලාත්මක වූ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් දේශීය මිල ස්ථායීතාව ළඟා කර ගැනීම හා පවත්වා ගැනීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීම යන මහ බැංකුවේ කාර්යභාරය වඩාත් තහවුරු විය. මහ බැංකු පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණ ලෙස මිල ස්ථායීතාව සහ අනෙක් අරමුණ ලෙස මූල්‍ය පද්ධති ස්ථායීතාව නියමකර ඇත. එමගින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස හඳුනාගෙන ඇති අතර, නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය ඒ සඳහා සහාය සපයනු ඇත. එපමණක් නොව, මහ බැංකුව සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස ද නම් කර තිබේ. 2022 වසරේ දරුණු ආර්ථික අර්බුදයත් සමඟ ඇති වූ ආර්ථික අභියෝග රාශියක් මධ්‍යයේ මහ බැංකු පනත බලාත්මක කරන ලදී. ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ සහාය ද ඇතිව රජය සමඟ එක්ව මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද විචක්ෂණශීලී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ අර්බුද අවස්ථාවට අදාළ ප්‍රතිචාර මගින් සාර්ව ආර්ථික ස්ථාවරත්වය බොහෝ දුරට යළි ස්ථාපනය කෙරිණි. හිතකර උද්ධමන ප්‍රවණතා සහ බාහිර අංශයේ ඇති වූ යහපත් තත්ත්වය සැලකිල්ලට ගනිමින්, 2023 වසරේ ජූනි මාසයේ සිට දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක සිට ලිහිල් ස්ථාවරයක් කරා යොමු විය. තෝරාගත් ණය උපකරණ සඳහා වන පොලී අනුපාතික මත සීමා පැනවීම, අවිනිශ්චිතතා මධ්‍යයේ ඵලදායී ලෙස මුදල් ප්‍රතිපත්තිය සන්නිවේදනය කිරීම, සහ වෙළඳපොළ තුළ ද්‍රවශීලතා තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග හමුවේ මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය වේගවත් වූ අතර, 2023 වසර අවසානය වන විට වෙළඳපොළ පොලී අනුපාතිකවල කැපී පෙනෙන පහත වැටීමක් සිදු විය. ලිහිල් කෙරුණු මුදල් තත්ත්වයන්හි බලපෑම මූර්ත ආර්ථිකයට ව්‍යාප්ත වීමෙහි සලකුණු පෙන්නුම් කරමින්, 2023 වසරේ ජූනි මාසයේ සිට පෞද්ගලික අංශයේ ණය සංකෝචනය වීමේ ප්‍රවණතාවයෙහි වෙනස් වීමක් දක්නට ලැබුණි. විදේශීය අංශය පිළිබඳව සැලකීමේ දී, 2022 වසරේ මැද භාගයේ සිට විනිමය අනුපාතිකය තීරණය කිරීම සඳහා වෙළඳපොළ වෙත ලබාදෙන ලද දෛනික මාර්ගෝපදේශයන් අත්හිටුවමින්, 2023 වසරේ මාර්තු මාසයේ දී වඩාත් නම්‍යශීලී ලෙස විනිමය අනුපාතිකය තීරණය වීම සඳහා මහ බැංකුව විසින් ඉඩ ප්‍රස්තා සලසන ලදී. වෙළඳපොළ තුළ විදේශ විනිමය ද්‍රවශීලතාවය වර්ධනය වීමට අනුකූලව, විනිමය අනුපාතිකය වෙළඳපොළ බලවේගවලට අනුව නිදහසේ තීරණය වීමට ඉඩ ලබා දෙන ලදී. දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ අනවශ්‍ය ලෙස විශාල උච්චාවචන ඇතිවීම වැළැක්වීම සහ දළ නිල සංචිත වර්ධනය කිරීම පමණක් අරමුණු කරගනිමින් මහ බැංකුව විසින් වෙළඳපොළ වෙත මැදිහත්වීම් සිදු කරන ලදී. විදේශීය අංශයේ ඇති වූ වැඩිදියුණු වීම සහ විශ්වාසය නැවත ගොඩනැගීම පිළිබිඹු කරමින්, විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වූ අතර දළ නිල සංචිත සැලකිය යුතු ලෙස වර්ධනය විය. මේ අතර, විදේශ විනිමය අර්බුදය තුළ මහ බැංකුව සහ රජය විසින් ක්‍රියාත්මක කර තිබූ නියාමන සීමාවන්ගෙන් බහුතරයක් 2023 වසරේ දී ක්‍රමයෙන් ලිහිල් කෙරිණි. මූල්‍ය ක්ෂේත්‍රය තුළ, මහ බැංකුවේ විචක්ෂණ නියාමන ක්‍රියාමාර්ග සහ අර්බුද අවස්ථා සඳහා පෙර සූදානම මගින් මූල්‍ය ආයතනවලට ආර්ථික අර්බුදය හමුවේ ඇතිවූ බලපෑමට මුහුණ දීමට හැකි වූ අතර, එමගින් දේශීය මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ආරක්ෂා විය. 2023 වසරේ දී, බැංකු අංශයේ පවතින ව්‍යුහාත්මක දුර්වලතා හඳුනා ගැනීමට සහ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට ප්‍රධාන බැංකු නවයක් සඳහා වත්කම්වල ගුණාත්මක බව පිළිබඳ සමාලෝචනයක් සිදු කරන ලදී. මේ අතර, මහ බැංකුව විසින් රටේ සාර්ව විචක්ෂණ අධිකාරියෙහි කාර්යභාරය ඵලදායී ලෙස ඉටු කිරීමට ඉඩ සැලසීම සඳහා ආයතන අතර අන්තර් සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම සිදු කරමින්, අදාළ රාමු සහ ක්‍රමවේද සකස් කෙරෙමින් පවතී. මහ බැංකු පනතේ අවශ්‍යතාවන්ට අනුකූලව, ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම 2023 වසරේ දී මහ බැංකුවේ

**ප්‍රාදේශීය සංවර්ධනය සම්බන්ධ ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවක් බවට පත්විය. තවද, විදේශ ගනුදෙනු සඳහා සක්‍රීයව පහසුකම් සලසන අතරම, ඩිජිටල් ගෙවීම් සහ විද්‍යුත් මුදල් සේවා ප්‍රවර්ධනය කිරීම මහ බැංකුව තවදුරටත් ඉදිරියට සිදු කළේය. ඵලදායී ආකාරයෙන් මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව සහතික කිරීම සඳහා මහ බැංකුවට වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණය ආරම්භ කිරීමට හැකි වන පරිදි රෙගුලාසි නිකුත් කරන ලදී. මේ අතර, ලෝක බැංකුව මගින් ලබා දෙන ලද මූල්‍යනය හරහා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය ශක්තිමත් කෙරුණු අතර, මුදල් අමාත්‍යාංශය සමග එක්ව අතිරේක අරමුදල් සම්පාදනය කිරීමේ ක්‍රමෝපායක් ස්ථාපිත කිරීමට පියවර ගෙන ඇත.**

## 2.1 මුදල් ප්‍රතිපත්ති රාමුව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම යන අරමුණ 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී බලාත්මක කරන ලද 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් වඩාත් තහවුරු කරන ලදී.** ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව, දේශීය මිල ස්ථායීතාව ළඟා කර ගැනීම සහ පවත්වා ගැනීම මහ බැංකුවේ ප්‍රධාන අරමුණ වේ. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නිල වශයෙන් පිළිගන්නා අතර, සාක්ෂාත් කරගත යුතු උද්ධමන ඉලක්කය සඳහන් කරමින් මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව අතර මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමක් අත්සන් කිරීම අවශ්‍ය වේ. කාලයත් සමඟ මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත ක්‍රමයෙන් අනුගත වුවද, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නිල වශයෙන් භාවිතා කිරීමට අවශ්‍ය නීතිමය පසුබිම ශ්‍රී ලංකා මහ බැංකු පනත හඳුන්වාදීමත් සමඟ ස්ථාපිත විය. ඒ අනුව, මතුපිට උද්ධමනය සියයට 5ක ඉලක්කගත මට්ටමක පවත්වාගෙන යෑමට 2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී මහ බැංකුව මුදල් අමාත්‍යවරයා සමඟ ගිවිසුමකට එළැඹුණි.[1] උද්ධමනය සඳහා ඉලක්කය සෑම වසර තුනකට වරක් සමාලෝචනය කළ හැකි අතර, සුවිශේෂී තත්ත්වයක් මත ඊට පෙර වෙනස් කිරීම සඳහා සලකා බැලීමට හැකියාව ඇත. මහ බැංකුවේ විනිවිදභාවය සහ මහජන වගවීම වැඩි දියුණු කිරීම සඳහා වූ විධිවිධාන ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි ඇතුළත් වේ. ඒ අනුව, උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට මහ බැංකුව අපොහොසත් වුවහොත්,[2] මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර එම වාර්තාව මහජනතාවට ද ලබාදිය යුතුය. උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට අපොහොසත් වීමට හේතු, මහ බැංකුව විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට ගතවන කාල සීමාව පිළිබඳ ඇස්තමේන්තුවක් මෙම වාර්තාවේ ඇතුළත් විය යුතුය. මේ අතර, මහ බැංකුවේ කාර්යභාරය ඵලදායී ලෙස ඉටු කිරීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති ශක්තිමත් කරමින් මහ බැංකුවේ මෙහෙයුම් සහ මූල්‍ය ස්වාධීනත්වය ඉහළ නැංවීමට මහ බැංකු පනත මගින් අවස්ථාව සලසන ලදී. ඒ අනුව, මහ බැංකු පනත මගින් දක්වා ඇති සුවිශේෂී තත්ත්වයන්හි දී හැර, මහ බැංකුව විසින් රජයේ අයවැය හිඟය මූල්‍යනය කිරීම තහනම් කර ඇත. රජයේ වියදම් මූල්‍යනය සඳහා මහ බැංකුව විසින් සපයන තාවකාලික අත්තිකාරම් සඳහා ද සීමා හඳුන්වා දී ඇත. උද්ධමන අපේක්ෂා හොඳින් පාලනය වන බව තහවුරු වන අතර ම ඉදිරි කාලයේ දී ශ්‍රී ලංකාවේ උද්ධමනය අඩු සහ ස්ථායී මට්ටමක පවත්වා ගැනීමට මහ බැංකු පනතෙහි විධිවිධාන උපකාරී වනු ඇති අතර, එමගින් ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ සැලසෙනු ඇත. මේ අතර, රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය ස්ථායීතා ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීම සඳහා සම්බන්ධීකරණ සභාව පිහිටුවීමට ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් අවස්ථාව ලබා දී ඇති අතර, එහි සාමාජිකයන් ලෙස, එම සභාවේ සභාපතිවරයා ලෙස ද කටයුතු කරන මහ බැංකුවේ අධිපති, භාණ්ඩාගාරයේ ලේකම් සහ ආර්ථික ප්‍රතිපත්ති විෂයය පවරන ලද අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ[3] ලේකම් කටයුතු කරති. මෑත කාලීන සාර්ව ආර්ථික වර්ධනයන්, ඉදිරි දැක්ම සහ අවදානම් පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීම සඳහා සම්බන්ධීකරණ සභාව කාර්තුවකට වරක් රැස්වේ.

1 මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම 2023 ඔක්තෝබර් 5 දිනැති අංක 2352/20 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය යටතේ මහජනතාවට සන්නිවේදනය කරන ලදී.

2 කාර්තුමය සාමාන්‍ය (වාර්ෂික ලක්ෂ්‍යමය) මතුපිට උද්ධමනය (කො.පා.මි.ද. මත පදනම් වූ) අඛණ්ඩව කාර්තු දෙකක් සඳහා ප්‍රතිශතාංක ±2ක ආන්තිකයකින් ඉලක්කගත අනුපාතිකයෙන් විතැන් වුවහොත්.

## 2.2 මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ ක්‍රියාමාර්ග

**මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, 2022 වසරේ දී ක්‍රියාත්මක වූ ඉතා දැඩි මුදල් ප්‍රතිපත්තියේ සිට 2023 වසරේ අග භාගයේ දී ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් දක්වා ක්‍රමානුකූලව වෙනස් විය.**

3 ආර්ථික ප්‍රතිපත්ති විෂයය මුදල් අමාත්‍යවරයා වෙත නොව වෙනත් අමාත්‍යවරයෙකු වෙත පවරනු ලැබ ඇති අවස්ථාවක දී.

උද්ධමනය සැලකිය යුතු ලෙස අඩු වීම හා උද්ධමන අපේක්ෂා මනාව පාලනය වීම, දේශීය ආර්ථිකයේ අඩු ඉල්ලුම් තත්ත්ව මධ්‍යයේ පහළ ගිය ආර්ථික ක්‍රියාකාරකම් සහ විදේශීය අංශයේ පීඩන ලිහිල් වීම මගින් මහ බැංකුවට 2023 වසර තුළ දී ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කිරීමට මග පැදුණි. 2022 සැප්තැම්බර් මාසයේ දී උද්ධමනය උපරිම අගයක් වාර්තා කිරීමෙන් පසුව අපේක්ෂිත නිර්-උද්ධමන ක්‍රියාවලියට අනුකූලව මහ බැංකුව විසින් 2022 වසර අවසාන කාලයේ සිට පොලී අනුපාතික ඒවායේ ඉහළ මට්ටමේ සිට පහළ දැමීම සඳහා මූල්‍ය වෙළඳපොළ වෙත පෙළඹවීම් ඇති කරන ලදී. අධික වෙළඳපොළ පොලී අනුපාතික 2022 වසරේ අවසාන කාලයේ සිට ක්‍රමයෙන් අඩු වුවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා. මූ. අරමුදලේ) විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ පිළිබඳ අවසන් එකඟතාවයකට පැමිණීමට සියලු 'පූර්ව ක්‍රියාමාර්ග' සපුරාලීම සඳහා 2023 මාර්තු මස මුල් කාලයේ ප්‍රතිපත්ති පොලී අනුපාතික, එනම් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින් ඉහළ නැංවීමට මහ බැංකුවට සිදු විය. කෙසේ වෙතත්, මෙම ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම මූලික සාකච්ඡාවල දී තීරණය කළ ප්‍රමාණයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අඩු අගයකි. මෙම ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම මධ්‍යයේ වුවද, මහ බැංකුවේ ඵලදායී සන්නිවේදනය හේතුවෙන් ප්‍රතිපත්ති පොලී අනුපාතික වැඩිවීම මගින් වෙළඳපොළ පොලී අනුපාතික මත ඇතිවන බලපෑම සමනය කළේය. උද්ධමනයේ අඛණ්ඩ පහළ යෑමත් සමඟ මහ බැංකුව 2023 ජූනි මස ආරම්භයේ දී මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම ආරම්භ කළ අතර, 2023 වසර තුළ අවස්ථා හතරක දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 650කින් අඩු කරන ලදී. සමස්ත වෙළඳපොළ ණය පොලී අනුපාතිකවල මන්දගාමී අඩු වීම සැලකිල්ලට ගනිමින්, මහ බැංකුව විසින් 2023 අගෝස්තු මස අවසානයේ දී තෝරාගත් ණය උපකරණ සඳහා වූ පොලී අනුපාතික මත උපරිම සීමා පනවන ලද අතර ඒ හරහා ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව එම උපකරණ සඳහා වූ අධික පොලී අනුපාතික අඩු කිරීමට නියෝග ලබා දෙන ලදී. රුපියල් ණය සහ අත්තිකාරම් සඳහා වන සමස්ත වෙළඳපොළ පොලී අනුපාතික පහළ දැමීම සඳහා 2023 ජූලි මස අවසානයේ පැවති මට්ටමට සාපේක්ෂව 2023 වසර අවසානය වන විට ණය පොලී අනුපාතික අවම වශයෙන් පදනම් අංක 350කින් අඩු කළ යුතු බවට පුළුල් මාර්ගෝපදේශ මහ බැංකුව විසින් බැංකු වෙත නිකුත් කරන ලදී. එමෙන්ම, සමස්ත වෙළඳපොළ ණය පොලී අනුපාතික ප්‍රතිපත්ති පොලී අනුපාතිකවලට අනුරූප මට්ටමට පහළ යෑම සහතික කිරීම සඳහා බැංකු අංශය සමඟ නිරන්තර සන්නිවේදනය සිදු කරන ලදී. 2024 මාර්තු මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 50කින් අඩු කිරීම මගින් මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කිරීමට පියවර ගන්නා ලද අතර, ඒ හරහා අඩු උද්ධමනයක් පවතින වාතාවරණයක දී වෙළඳපොළ ණය පොලී අනුපාතික තවදුරටත් අඩු කිරීම තුළින් ණය වර්ධනයට සහ ආර්ථික ක්‍රියාකාරකම්වල යථා තත්ත්වයට පත්වීමට සහාය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**2023 වසරේ දී දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්ව වැඩිදියුණු කිරීමට පියවර ගන්නා ලදී.** 2023 අගෝස්තු මාසය දක්වා කාලය තුළ දී දේශීය මුදල් වෙළඳපොළ සමස්ත ද්‍රවශීලතාව විශාල වශයෙන් හිඟ මට්ටමක පැවති අතර, එය මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග වෙළඳපොළ පොලී අනුපාතික වෙත ඵලදායී ලෙස සම්ප්‍රේෂණය වීමට බාධාවක් වී ඇතැයි අපේක්ෂා කෙරිණි. ඒ අනුව, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීමට සමගාමීව, දේශීය මුදල් වෙළඳපොළේ පැවති අඛණ්ඩ ද්‍රවශීලතා හිඟය අවම කිරීම සඳහා මහ බැංකුව ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කළේය. බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා අදාළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2023 වසරේ අගෝස්තු 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 4.00 සිට සියයට 2.00 දක්වා අඩු කරන ලද අතර, එමගින් දේශීය මුදල් වෙළඳපොළට රුපියල් බිලියන 200ක පමණ ද්‍රවශීලතාව ලබා දෙන ලදී. තවද, අඛණ්ඩ හිඟ ද්‍රවශීලතා පීඩන සහිත බලපත්‍රලාභී බැංකුවල ද්‍රවශීලතා තත්ත්ව වැඩිදියුණු කිරීමේ අරමුණින් මහ බැංකුව විසින් විශේෂ ද්‍රවශීලතා ආධාරක පහසුකම් සපයන ලදී. මීට අමතරව, පූර්වෝපායී පියවරක් ලෙස, ඕනෑම මූල්‍ය අවදානම් අවස්ථාවක බලපත්‍රලාභී බැංකුවලට අරමුදල් සැපයීමට හැකි වන පරිදි මහ බැංකුව සිය හදිසි ද්‍රවශීලතා පහසුකම් සඳහා වූ රාමුව ශක්තිමත් කළේය. මහ බැංකුව එක්දින ප්‍රතිවිකුණුම් වෙන්දේසිවලට අමතරව අවශ්‍යතා පරිදි කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි හරහා ද්‍රවශීලතාව කාලීන පදනමින් ලබා දෙමින් විවට වෙළඳපොළ

කටයුතු ද සිදු කරන ලදී. තවද, ස්ථාවර පදනමින් ද්‍රවශීලතාව ලබා දීමේ අරමුණින්, භාණ්ඩාගාර බැඳුම්කර ස්ථාවර පදනමින් මිලදී ගැනීම සඳහා වෙන්දේසි 2023 වසරේ දී සහ 2024 වසරේ මුල් සති කිහිපය තුළ දී සිදු කරන ලදී.

**මහ බැංකුවේ එක්දින පදනමින් අරමුදල් සැපයීමේ පහසුකම් මත බලපත්‍රලාභී වාණිජ බැංකු අධික ලෙස රඳා පැවතීම අඩු කිරීම මගින් මුදල් වෙළඳපොළ නැවත සක්‍රීය කිරීමට ද පියවර ගන්නා ලදී.** 2023 ජනවාරි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිත්‍ය පහසුකම් සඳහා ප්‍රවේශ වීම මත සීමා පනවන ලදී. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගත හැකි උපරිම වාර ගණන දින දර්ශිත මාසයක් තුළ පස් වතාවකට (05) සීමා කරන ලද අතර, නිත්‍ය ණය පහසුකම ලබා ගත හැකි ප්‍රමාණය ඕනෑම එක් දිනක් සඳහා අදාළ බැංකුවේ පවතින ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයෙන් සියයට 90ක් දක්වා සීමා කරන ලදී. මෙම සීමාවන් පැනවීම හරහා ද්‍රවශීලතා කළමනාකරණයට විකල්ප ක්‍රමවේද සඳහා යොමුවීමට බලපත්‍රලාභී බැංකු පොළඹවන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දේශීය මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම්වල නැවත සක්‍රීය වීමක් දක්නට ලැබුණු අතර, මහ බැංකු පහසුකම් මත බලපත්‍රලාභී වාණිජ බැංකු අධික ලෙස රඳා පැවතීම අඩු විය. මුදල් වෙළඳපොළෙහි නිරීක්ෂණය වූ වැඩිදියුණු වීම් සැලකිල්ලට ගනිමින්, නිත්‍ය පහසුකම් භාවිතය සඳහා පැවති සීමාවන් ක්‍රමයෙන් ලිහිල් කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව, නිත්‍ය ණය පහසුකම මත පැවැති සීමා ඉවත් කරන ලදී. නිත්‍ය තැන්පතු පහසුකම සඳහා වූ සීමාව 2024 පෙබරවාරි මැද දී සංචිත පවත්වා ගෙන යැමේ කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි මාසයක් තුළ වාර දහයක් (10) දක්වා ලිහිල් කරන ලද අතර, 2024 අප්‍රේල් සිට බලපැවැත්වෙන පරිදි එම සීමාව සම්පූර්ණයෙන් ම ඉවත් කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී.

**ඉහත දැක්වූ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ මෙහෙයුම්වල සහාය ඇතිව 2023 වසරේ දී වෙළඳපොළ පොලී අනුපාතික අඩු වූ අතර සමස්ත ණය තත්ත්වය වැඩිදියුණු විය.** නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ වෙළඳපොළ පොලී අනුපාතික මෙහෙයවීම සඳහා මෙහෙයුම් ඉලක්කය ලෙස මහ බැංකුව විසින් සමීපව නිරීක්ෂණය කරනු ලබන කෙටි කාලීන පොලී අනුපාතිකය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, 2023 වසරේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ පහළ සීමාව දක්වා අඩු විය. මෙම ප්‍රවණතා මෙන්ම දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය ප්‍රකාශයට පත් කිරීම සහ ඒ හා සම්බන්ධ අවදානම් අධිමිල අඩු වීම හේතුවෙන් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික 2023 වසර තුළ දී සැලකිය යුතු ලෙස අඩු වූ අතර එමගින් සමස්ත වෙළඳපොළ පොලී අනුපාතික අඩු වීම සඳහා සහාය ලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ආර්ථිකයේ පොලී අනුපාතික ව්‍යුහය සාමාන්‍යකරණය වූ අතර පෞද්ගලික අංශයට ලබා දෙන ණය ප්‍රසාරණය සඳහා යම් සහායක් ලබාදෙන මට්ටම් දක්වා වෙළඳපොළ ණය පොලී අනුපාතික පහළ ගියේය. ඒ අනුව, 2022 වසරේ මැද සිට අඛණ්ඩව සංකෝචනය වූ පෞද්ගලික අංශයට ලබා දුන් ණය, දේශීය ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් වීම සඳහා සහාය සලසමින් 2023 ජූනි මස සිට 2023 වසර අවසානය දක්වා මාසික පදනමින් ප්‍රසාරණය වීමක් වාර්තා විය. එම ණය ප්‍රසාරණය මධ්‍යයේ වුව ද 2023 ජනවාරි සිට මැයි දක්වා කාලය තුළ දී සැලකිය යුතු ලෙස ණය සංකෝචනය වීම හේතුවෙන්, 2023 වසර අවසානය වන විට පෞද්ගලික අංශයට ලබා දුන් ණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 0.6කින් සංකෝචනය විය. මේ අතර, රජය මෙන්ම රජය සතු වාණිජ ව්‍යාපාර ඇතුළත් රාජ්‍ය අංශයට බැංකු පද්ධතිය විසින් ලබා දුන් ණය ද 2023 වසරේ දී සංකෝචනය විය. ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමඟ මහ බැංකුව විසින් රජය වෙත මූල්‍යන ලබා දීම සඳහා වූ ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් ම වෙනස් විය. ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමඟ මාස දහ අටක් සඳහා මහ බැංකුව විසින් රජය වෙත මූල්‍යන ලබා දීමේ තාවකාලික විධිවිධාන පැවතිය ද මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය අඩු කරගනිමින් මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය අඩු කර ගන්නා ලද අතර, එය ජා. මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළට ද අනුකූල විය. මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය ක්‍රමයෙන් අඩු වීමත්, දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව වැඩිදියුණු වීම හා නිත්‍ය ණය පහසුකම ලබා ගැනීමට පැවති සීමා හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළඳුන් රජයේ සුරැකුම්පත් ලබා දී මහ බැංකුවේ නිත්‍ය ණය පහසුකම හරහා අරමුදල් ලබා ගැනීම අඩු වීමත් හේතුවෙන් 2023 වසරේ දී මහ බැංකුව විසින් රජයට ලබා දුන් ශුද්ධ ණය සංකෝචනය විය. ඒ අතරම,

දළ නිල සංචිත ගොඩනංවා ගැනීම සඳහා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීම, මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑමට දායක විය.

**නිර්-උද්ධමන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යෑම, දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලියෙන් පසු අවදානම් අධිමිල අඩු වීමට අනුකූලව වෙළඳපොළ පොලී අනුපාතික අඩු වීම සහ වසරේ දෙවන භාගයේ පැවති ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයේ වේගවත් සම්ප්‍රේෂණයක් ඇති කිරීම කෙරෙහි 2023 වසරේ දී මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන උපායමාර්ගයෙහි අවධානය යොමු විය.** උද්ධමන අපේක්ෂා පාලනය කිරීම මගින් නිර්-උද්ධමන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය හා සම්බන්ධ අවිනිශ්චිතතා මධ්‍යයේ රාජ්‍ය සුරැකුම්පත් මත එලදා අනුපාතිකයට අදාළව සැලකිය යුතු අධිමිලක් අඛණ්ඩව පැවතීම හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික සහ ප්‍රතිපත්ති පොලී අනුපාතික අතර ඇති වූ විශාල පරතරය අඩු කිරීමට මූල්‍ය ආයතන පෙළඹවීම කෙරෙහි 2023 වසරේ මුල් භාගය තුළ දී මහ බැංකුවේ සන්නිවේදන උපායමාර්ගයේ අවධානය යොමු විය. මහජනතාවගේ යහපත උදෙසා ලිහිල් මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය කඩිනම් කිරීම කෙරෙහි වසරේ දෙවන භාගයේ දී මහ බැංකුවේ සන්නිවේදනයේ අවධානය යොමු විය. වසර තුළ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය වඩාත් හොඳින් සිදුකිරීම සඳහා මහ බැංකුව විසින් සාම්ප්‍රදායික ක්‍රම මෙන්ම සමාජ මාධ්‍ය ද භාවිතා කරන ලදී. භාෂා ත්‍රිත්වයෙන් ම නිකුත් කරන ලද මාධ්‍ය නිවේදන මගින් මුදල් ප්‍රතිපත්ති නිවේදන සන්නිවේදනය කරන ලද අතර, ඊට අමතරව මහ බැංකු අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් ඒ පිළිබඳ මාධ්‍ය සාකච්ඡා පැවැත්වීමට කටයුතු කරන ලදී. මෙම මාධ්‍ය සාකච්ඡා සමාජ මාධ්‍ය හරහා සජීවීව විකාශය කරන ලද අතර, වැදගත් පණිවිඩ කෙටි වීඩියෝ කොටස් ලෙස මහ බැංකුවේ සමාජ මාධ්‍ය නාලිකාවල පල කරන ලදී. උද්ධමනයේ අපේක්ෂිත වර්ධනයන් පිළිබඳව ආර්ථිකයේ පාර්ශ්වකරුවන්ට මග පෙන්වීම හරහා මැදි කාලීන උද්ධමන අපේක්ෂාවන් පාලනය කිරීමට සහාය වීම සඳහා මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ මාධ්‍ය නිවේදනයේ සහ උද්ධමනය පිළිබඳ මාධ්‍ය නිවේදනයේ උද්ධමන ව්‍යාප්ති සටහන ප්‍රකාශයට පත් කිරීමේ කාර්යය වසර පුරා අඛණ්ඩව ක්‍රියාත්මක විය. ඉදිරි දැක්මක් සහිත තොරතුරු ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන්නා වූ නම්‍යශීලි උද්ධමන ඉලක්කකරණ මුදල් ප්‍රතිපත්ති රාමුවට අනුකූලව, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන උපායමාර්ගයේ සිදු වූ සැලකිය යුතු විකාශනයක් මෙම සන්නිවේදන ක්‍රමය මගින් සනිටුහන් විය. මේ අතර, මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ දැනුම්වත් කිරීම පිණිස විවිධ සම්මන්ත්‍රණ සහ වැඩසටහන් සඳහා මහ බැංකු අධිපති සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු සහභාගි වූහ. මෙයට සමගාමීව, මහ බැංකුව විසින් සිය වාර්ෂික වාර්තාව ඇතුළුව අනෙකුත් ප්‍රකාශන නියමිත වේලාවට ප්‍රකාශයට පත් කිරීම සිදු කරන ලදී. 2023 වසරේ ජූලි මාසයේ දී මහ බැංකුවේ පළමු මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කිරීම මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන උපායමාර්ගයේ වැදගත් පියවරක් විය. අදාළ කාල සීමාව තුළ ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති තීරණ සඳහා හේතු සාධක වූ කරුණු සන්නිවේදනය කිරීම මගින් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ වගවීම ඉහළ නැංවීමට දායක වීම මෙම ප්‍රකාශනයේ ප්‍රධාන අරමුණ වේ. මීට අමතරව, ආර්ථිකයේ පාර්ශ්වකරුවන්ට ඉදිරි දැක්මක් සහිත තොරතුරු මත පදනම්ව දැනුම්වත් ආර්ථික තීරණ ගැනීමට අවශ්‍ය ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යවල අපේක්ෂිත වර්ධනයන් සන්නිවේදනය කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති වාර්තාව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මහ බැංකු පනතේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයට අනුව, මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති වාර්තාව ද්වි-වාර්ෂිකව ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය වන අතර, ඒ අනුව, ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් ලෙස පළමු මුදල් ප්‍රතිපත්ති වාර්තාව 2024 වසරේ පෙබරවාරි මාසයේ දී ප්‍රකාශයට පත් කළේය. මෙම මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කිරීමත් සමඟම, එම වාර්තාවේ අන්තර්ගතය වැඩි පිරිසක් වෙත ළඟා කරවීම වැඩිදියුණු කිරීමේ අරමුණින්, එහි වැදගත් කරුණු උද්දීපනය කරන තාක්ෂණික නොවන කෙටි වීඩියෝ කොටස් මහ බැංකුවේ සමාජ මාධ්‍ය නාලිකා හරහා පල කරන ලදී. මීට අමතරව, මුදල් ප්‍රතිපත්ති වාර්තා ද්විත්වය නිකුත් කිරීමේ දී මාධ්‍යවේදීන්, සහ ශාස්ත්‍රඥයන් හා වෘත්තිකයන් සඳහා වෙන වෙනම තාක්ෂණික දැනුම්වත් කිරීමේ සැසි පවත්වනු ලැබීය. මහ බැංකුවේ ප්‍රධාන අරමුණ වන මිල ස්ථායීතාවය පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන උද්ධමන අපේක්ෂාවන් පාලනය කිරීමට, ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය ඉහළ නැංවීමට සහ අවිනිශ්චිතතා අවම කිරීමට ඵලදායී මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය උපකාරී වේ. තවද, පැහැදිලි සන්නිවේදනය, ආර්ථික ස්ථායීතාවයට

සහ කම්පනයන්ට ඔරොත්තු දීමේ හැකියාවට දායක වෙමින්, මුදල් ප්‍රතිපත්තියේ විශ්වසනීයත්වය සහ ඵලදායීත්වය ඉහළ නංවනු ලබයි. ඒ අනුව, අනෙකුත් සාධක අතර, මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනයේ ඵලදායීතාව ඉහළ නැංවීමට 2023 වසරේ දී මහ බැංකුව ගත් උත්සාහයන්, නිර්-උද්ධමන ක්‍රියාවලියට, වෙළඳපොළ පොලී අනුපාතිකවල අවදානම් අධිමිල අඩු වීමට සහ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මූල්‍ය අංශයට හා මූර්ත ආර්ථිකයට වේගයෙන් සම්ප්‍රේෂණය වීමට සහාය වී ඇත.

2

## 2.3 විදේශීය අංශයේ ප්‍රතිපත්ති

### 2.3.1 විනිමය අනුපාතික ප්‍රතිපත්තිය

**ශ්‍රී ලංකාව 2023 වසරේ වැඩි කාලපරිච්ඡේදයක් තුළ නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් අනුගමනය කළේය.** දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාව වැඩිදියුණු වීම සැලකිල්ලට ගනිමින් 2022 වසරේ මැයි මාසයේ සිට වෙළඳපොළට ලබා දුන් දෛනික මාර්ගෝපදේශය අත්හිටුවමින් 2023 වසරේ මාර්තු 07 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකුව විසින් විනිමය අනුපාතිකය වඩා නම්‍යශීලීව තීරණය වීමට ඉඩ හරින ලදී. ඒ අනුව, විනිමය අනුපාතිකයෙහි අධික විචලනයන් වැළැක්වීම සඳහා සහ වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීම් හරහා දළ නිල සංචිත රැස්කර ගැනීම පමණක් ඉලක්ක කර ගත් මහ බැංකුවේ සීමිත මැදිහත්වීම් සමඟ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වයන් මත පදනම්ව විනිමය අනුපාතිකය තීරණය වීමට ඉඩ හරින ලදී. 2022 වසරේ මාර්තු මස මුල දී විනිමය අනුපාතිකයේ ක්‍රමානුකූල ගැළපීමකට ඉඩ හැරීමට පෙර, 2021 වසරේ දී සහ 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී, ශ්‍රී ලංකා රුපියල ස්ථාවර මට්ටම්වල පවත්වා ගෙන යන ලදී. කෙසේ වෙතත්, විනිමය අනුපාතිකය විශාල ලෙස අවප්‍රමාණය වීම නිසා මෙම ගැළපුම යටතේ බලාපොරොත්තු වූ ප්‍රතිඵල ළඟා කර ගැනීමට නොහැකි විය. ඒ අනුව, 2022 වසරේ අප්‍රේල් මස අවසන් වන විට ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. මෙම අස්ථාවරත්වය හේතුවෙන්, අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොළ වෙත දෛනිකව වෙළඳපොළ මාර්ගෝපදේශ සැපයීම මහ බැංකුව විසින් 2022 වසරේ මැයි 13 දින සිට ආරම්භ කරන ලද අතර, එතුළින් දිනක් තුළ සිදු වූ සැලකිය යුතු විචලනයන් සහිත විනිමය අනුපාතිකය ස්ථාවර කර ගැනීමට උපකාරී විය. මෙය ක්‍රියාත්මක කරන ලද්දේ දෛනික පදනමින් මධ්‍ය එතැන් විනිමය අනුපාතිකයක් සහ එම මධ්‍ය එතැන් විනිමය අනුපාතිකයේ දෙපස (+/-) විචලන සීමාවන් ප්‍රකාශයට පත් කිරීමෙනි. මෙම සීමාව රු. 1.00 සිට රු. 10.00 දක්වා පරාසයක විචලනය වූ අතර, කලින් කලට මධ්‍ය එතැන් විනිමය අනුපාතිකය මත සමමිතික හෝ අසමමිතික වන ලෙස මෙය පවත්වා ගැණුනි. මෙම ක්‍රියාමාර්ග සමඟ, මෙම ප්‍රතිපත්තියෙහි ප්‍රතිඵලදායක බව පිළිබිඹු කරමින් එය ක්‍රියාත්මක වූ කාලසීමාව තුළ විනිමය අනුපාතිකයේ වැඩි ස්ථාවරත්වයක් නිරීක්ෂණය විය. දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ක්‍රියාකාරකම් දිරිමත් කිරීම සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව වෙළඳපොළ මත පදනම් වූ විනිමය අනුපාතිකයක් නැවත ඇති කිරීමේ අරමුණින්, මහ බැංකුව විසින් දෛනික විචලන සීමාවන් ක්‍රමානුකූලව ලිහිල් කිරීම ආරම්භ කරන අතර ම, බලපත්‍රලාභී බැංකු විසින් රුපියල්වලට පරිවර්තනය කරන ලද අපනයන ආදායම අනිවාර්යයෙන් මහ බැංකුවට විකිණීමේ අවශ්‍යතාවය ලිහිල් කරන ලදී. වෙළඳපොළට ලබා දුන් දෛනික මාර්ගෝපදේශය 2023 වසරේ මාර්තු මස මුල වන විට නතර කරන ලද අතර රුපියල්වලට පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ සේවා අංශය ආශ්‍රිත අපනයන ලැබීම් සහ රුපියල්වලට පරිවර්තනය කරන ලද භාණ්ඩ අපනයන ආදායමේ ඉතිරි වටිනාකම මත වැනි බලපත්‍රලාභී බැංකු මත පනවා තිබූ අනිවාර්ය විකිණුම් අවශ්‍යතාවය (සතිපතා මහ බැංකුවට විදේශ විනිමය විකිණීම සඳහා) වැනි 2022 වසරේ දී ක්‍රියාත්මක වූ විදේශ විනිමය පරිවර්තනය කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති 2023 වසරේ මාර්තු මාසයේ දී අවලංගු කරන ලදී. ඒ අනුව, දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ද්‍රවශීලතා තත්ත්ව සහ වෙළඳපොළ අපේක්ෂා කැපී පෙනෙන ලෙස වැඩිදියුණු විය. එපමණක් නොව, ආමුඛ ආයෝජන විදේශ විනිමය හුවමාරු ගිවිසුම් (Inward Investments Swaps - IIS) යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත 2020 වසරේ දී නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් ද 2023 වසරේ දී අවලංගු කරන ලදී. ඉහත ක්‍රියාමාර්ග වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්ව මෙන්ම වෙළඳපොළ අපේක්ෂා වැඩිදියුණු කිරීමට උපකාරී වෙමින් 2023 වසරේ ශ්‍රී ලංකා රුපියලේ අගය ඉහළ යාමට හේතු විය.

**මහ බැංකු පනත බලාත්මක කිරීම තුළින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුපූරක වන ලෙස නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් පවත්වාගෙන යෑමේ වැදගත්කම යළි අවධාරණය විය.** මහ බැංකු පනතට අනුව, දේශීය මිල ස්ථායීතාව

සාක්ෂාත් කර ගැනීම සහ පවත්වා ගැනීම සඳහා නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම මහ බැංකුවට පැවරී ඇත. නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් වැඩි දියුණු වූ සහ වඩා ද්‍රවශීලී විදේශ විනිමය වෙළඳපොළක් ගොඩනගා ගැනීමට ද අපේක්ෂා කෙරේ. මහ බැංකු පනත විසින් නියම කරන ලද නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමත් සමග, මින් පෙර විනිමය අනුපාතිකයෙහි පැවති අධිතක්සේරු වීම හරහා අපනයන අධෛර්යමත් වීමේ නැඹුරුව අනාගතයේ දී ඉවත් වනු ඇති අතර දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ විනිමය අනුපාතිකය විදේශ විනිමය ඉල්ලුම සහ සැපයුමට අනුකූලව තීරණය වනු ඇත. නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තිය අනුගමනය කිරීමත් සමගම, වෙළඳපොළ විශ්වාසය සැලකිය යුතු ලෙස වැඩිදියුණු වීම තුළින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත සැලකිය යුතු ශුද්ධ ලැබීම් වාර්තා විය. ඒ අනුව, වෙළඳපොළ මූලධර්මයන්ට අනුකූලව විනිමය අනුපාතිකය එ.ජ. ඩොලරයට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 12.1කින් සහ 2024 මාර්තු අවසානය වන විට සියයට 7.6කින් අතිප්‍රමාණය විය. මෙම ප්‍රවණතා හේතුවෙන්, 2023 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 1.7ක් සහ 2024 වසරේ පළමු කාර්තුවේ දී එ.ජ. ඩොලර් බිලියන 1.1ක් පමණ ශුද්ධ පදනම මත (වටිනාකම මත පදනම් වූ දිනයට අනුව) මිලදී ගැනීමට මහ බැංකුවට හැකි විය. තවද, කම්පනවලට ප්‍රතිචාර වශයෙන් විනිමය අනුපාතිකය ගැළපීමට ඉඩ සැලසීම මගින්, ගෙවුම් තුලනයේ ගැළපීම් හරහා විදේශීය අංශයේ ස්ථාවරත්වය නැවත ඇතිකර ගැනීමට හැකි වනු ඇති බැවින්, මෙම ප්‍රතිපත්තිය මගින් ශ්‍රී ලංකාවට බාහිර කම්පනවලින් ඇතිවිය හැකි දැඩි බලපෑම්වලින් ආරක්ෂා වීමට හැකි වනු ඇත.

### 2.3.2 විදේශ විනිමය සීමා කිරීම් සහ ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ ක්‍රියාමාර්ග

**විදේශ විනිමය අර්බුදය සමයේ දී ගත් බොහෝ පරිපාලන ක්‍රියාමාර්ග 2023 වසරේ දී ක්‍රමයෙන් ලිහිල් කරන ලදී.** 2021 සහ 2022 වසරවල ආර්ථික අර්බුදය සමයේ දී සහ ඊට පෙර කාලය තුළ, රජය, මහ බැංකුවේ උපදෙස් මත, දේශීය විදේශ විනිමය වෙළඳපොළේ පැවතුණු දැඩි විදේශ විනිමය හිඟය මගහරවා ගැනීම සඳහා විදේශ විනිමය සීමා කිරීම් සහ ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ ක්‍රියාමාර්ග ගණනාවක් පැනවීය. මීට අමතරව, මහ බැංකුව විසින් විදේශ විනිමය ගෙවීම් සීමා කිරීමට පියවර කිහිපයක් ක්‍රියාවට නැංවූ අතර, විදේශ විනිමය ලැබීම් දිරිමත් කරන ලදී. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්ව ක්‍රමයෙන් වැඩිදියුණු වීම සහ විදේශීය අංශයේ විවිධ අංශවල වැඩිදියුණු වෙමින් පවතින ඉදිරි දැක්ම අනුව එවැනි විදේශ විනිමය සීමා කිරීම් සහ අනෙකුත් සීමා බොහොමයක් 2023 වසරේ දී ඉවත් කරන ලදී. 2023 වසරේ මැයි මාසයේ දී, ණයවර ලිපි, ගෙවීම් මත ලියවිලි (Documents against Payment) සහ ප්‍රතිග්‍රහණය මත ලියවිලි (Documents against Acceptance) වැනි ගෙවීමේ නියමයන් මත ඇතැම් භාණ්ඩ ආනයනය කිරීමේ දී වසරකට පෙර පනවා තිබූ ප්‍රතිලාභයක් නොලැබෙන මුදල් ආන්තික තැන්පතු අවශ්‍යතාවය ඉවත් කරන ලදී. ඉවත් කරන ලද අනෙකුත් එවැනි සීමා කිරීම් අතරට, මහ බැංකුව විසින් විදේශ විනිමය සීමා කිරීම් සහ බලයලත් වෙළඳුන්ට අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමට අවශ්‍ය විදේශ විනිමය වෙත ප්‍රවේශ වීම සඳහා ප්‍රමුඛත්වය ලබා දීමට මහ බැංකුව විසින් ලබා දුන් අවිධිමත් මග පෙන්වීම ඇතුළත් වේ. මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව විසින් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ඇතැම් ජංගම ජාත්‍යන්තර ගනුදෙනු සඳහා ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමය බවට පරිවර්තනය කිරීමට පනවා තිබූ ඇතැම් සීමාවන් ඉවත් කිරීම සඳහා සහ විගාමිකයන් විසින් ජංගම ගනුදෙනුවලින් ඉපැයූ මුදල් එම රටවලට ප්‍රේෂණය කිරීම සම්බන්ධයෙන් පැවති යම් සීමාවන් ඉවත් කිරීම සඳහා අවශ්‍ය නියෝග සහ විධාන නිකුත් කරන ලදී. භාණ්ඩ අපනයන ඉපැයීම් නැවත මෙරටට ගෙන්වා ගැනීමේ අනිවාර්ය අවශ්‍යතාවය මත, අවලංගු කරන ලද 1953 අංක 24 දරන විනිමය පාලන පනත යටතේ ක්‍රියාත්මක වූ පෙර රෙගුලාසි, 2019 වසරේ ඔක්තෝබර් මස විදේශ විනිමය පනත යටතේ නැවත නිකුත් කරන ලදී. 2021 වසරේ පෙබරවාරි මාසයේ දී, රට වෙත ආපසු ගෙන්වා ගත් එවැනි අපනයන ඉපැයීම් සඳහා අනිවාර්ය පරිවර්තන අවශ්‍යතාවය හඳුන්වා දෙන ලදී. භාණ්ඩ අපනයනයට අමතරව, 2021 වසරේ ඔක්තෝබර් මාසයේ දී නැවත මෙරටට ගෙන්වා ගැනීමේ සහ අපනයන ආදායම රුපියල්වලට පරිවර්තනය කිරීමේ අනිවාර්ය අවශ්‍යතාවයට සේවා අපනයන ආදායම ද ඇතුළත් විය. කෙසේ වෙතත්, සේවා අපනයන ආදායමට අදාළ පරිවර්තන අවශ්‍යතාවය 2022 වසරේ අගෝස්තු මාසයේ දී ඉවත් කරන ලදී.

2

**ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ග ලෙස ප්‍රාග්ධන ගනුදෙනු මත පනවා තිබූ ඇතැම් අත්හිටුවීම් සහ සීමා කිරීම් ද 2023 වසර තුළ දී ලිහිල් කරන ලදී.** අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ දී රටෙහි ගෙවුම් තුලන තත්ත්වයන්ට සහාය වීමේ අරමුණ ඇතිව රජය සහ මහ බැංකුව විසින් විදේශ විනිමය ගෙවීම් අධෛර්යමත් කිරීම සඳහා ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ග කිහිපයක් අරඹන ලදී. ගෙවුම් තුලන තත්ත්වයන් වැඩිදියුණු වීමට පටන්ගැනීමත් සමඟ පෙර පනවා තිබූ ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණය කිරීමේ ඇතැම් ක්‍රියාමාර්ග ක්‍රමානුකූලව ලිහිල් කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් විසින් විදේශයන්හි ආයෝජන සිදු කිරීමේ අරමුණින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් (Outward Investment Accounts) හරහා සිදුකරනු ලබන ගෙවීම් සඳහා වූ තාවකාලික අත්හිටුවීම, යම් මට්ටමකට ලිහිල් කරන ලදී. කෙසේ වුවත්, තෝරාගත් ප්‍රාග්ධන ගනුදෙනු කිහිපයක් සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් හරහා ගෙවීම් සිදු කිරීම සඳහා සීමාවන් තවදුරටත් පවතී. මීට අමතරව, ශ්‍රී ලංකාවේ නේවාසිකයින් සතු ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Business Foreign Currency Accounts) හරහා සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා අදාළ ප්‍රතිමුඛ ප්‍රේෂණ මත වූ සීමා කිරීම් ද තවදුරටත් ලිහිල් කෙරිණි. කෙසේ වුවත්, ශ්‍රී ලංකාවේ නේවාසිකයින් සතු පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Personal Foreign Currency Accounts) හරහා සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ මත පනවා තිබූ තාවකාලික සීමා කිරීම් තවදුරටත් පවතී. තවද, විගාමිකයන් සඳහා සංක්‍රමණික දීමනාව යටතේ ශ්‍රී ලංකාවෙන් පිටතට අරමුදල් යැවීම මත පනවා තිබූ සීමාවන් තවදුරටත් ලිහිල් කරන ලදී. රජය සහ මහ බැංකුව, විදේශීය අංශයේ තත්ත්වයන්හි යම් සන්ධිස්ථානයන් කරා ළඟා වීමට යටත්ව, ඉතිරිව ඇති ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රමානුකූලව ඉවත් කිරීම පිළිබඳ සැලැස්මක් සකස් කර ඇත.

**මීට අමතරව, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි වත්මන් සහ අපේක්ෂිත වර්ධනයන් සැලකිල්ලට ගනිමින් වසර තුළ දී මහ බැංකුව තවදුරටත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හඳුන්වා දෙන ලදී.** රට තුළට විදේශ විනිමය ලැබීම් දිරිගැන්වීමේ පියවරක් ලෙස, ශ්‍රී ලංකාවේ සමාගම් සඳහා කොටස් ප්‍රාග්ධනය ලෙස ලැබෙන මුදලින් විදේශ ව්‍යවහාර මුදල් විශේෂ ගිණුම් - ආයෝජිත ගිණුම් (Special Foreign Currency Accounts - Investee) විවෘත කිරීමට සහ පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළඳුන් හට අවසර දෙන ලදී. සමුද්‍රීය ඉන්ධන ගබඩා කිරීම්, ප්‍රවාහන සහ සැපයුම් ආදී ව්‍යාපාරවල නියැළී සිටින ආයතන අතර ඇතැම් විදේශ විනිමය ගනුදෙනු පුළුල් කිරීම සඳහා, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ එම ගිණුම්වලට ණය පහසුකම් සැපයීම සම්බන්ධයෙන් ද විධාන නිකුත් කරන ලදී. තව ද, අපනයන ආදායම නැවත මෙරටට ගෙන්වා ගැනීම අධීක්ෂණය කිරීම ශක්තිමත් කිරීමේ පියවරක් ලෙස තෝරාගත් අපනයනකරුවන්ට තම අපනයන, ප්‍රේෂණ සමඟ සංසන්දනය කිරීමට ප්‍රවේශය ලබා දීම සඳහා 2022 වසරේ ජූනි මාසයේ දී හඳුන්වා දෙන ලද ස්වයංක්‍රීය අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතිය වසර තුළ තවදුරටත් වැඩිදියුණු විය. මීට අමතරව, (i) ණයවර ලිපි, ප්‍රතිග්‍රහණය මත ලියවිලි සහ ගෙවීම් මත ලියවිලි වැනි ගෙවීමේ නියමයන් යටතේ සිදු කරන ලද ඇතැම් භාණ්ඩ ආනයනය කිරීමේ දී ප්‍රතිලාභයක් නොලැබෙන ආන්තික මුදල් තැන්පතු අවශ්‍යතා වැනි ක්‍රියාමාර්ග; (ii) ද්වීපාර්ශ්වීය බලයලත් වෙළඳුන් සමඟ මිල කැඳවුම් ඉල්ලුම් සිදු නොකොට සෘජු එතැන් විනිමය ගනුදෙනු හරහා මහ බැංකුව විදේශ විනිමය සැපයීමේ දී සතිපතා සිදු කරන ගනුදෙනු ප්‍රමාණය මත බරිත සාමාන්‍ය විනිමය අනුපාතිකයක් යොදා ගැනීම; (iii) විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල ගනුදෙනු පිරිවැය ප්‍රතිපූර්ණය කිරීමෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරිගැන්වීමක් ලබාදීම යනාදී වඩා වාසිදායී විනිමය අනුපාතිකයක් ලබා දෙන, ජා. මූ. අරමුදල විසින් බහු විදේශ විනිමය භාවිතයන් (multiple currency practices) ලෙස හඳුනාගත් ක්‍රියාමාර්ග 2023 වසරේ දී ඉවත් කරන ලදී.

### 2.3.3 ආනයන සීමා ලිහිල් කිරීම

**වාහන ආනයන සීමා කිරීම් හැර, ප්‍රමුඛතා පදනමක් මත ආනයන සීමා ලිහිල් කිරීම් සිදු කිරීමට අදාළ මහ බැංකුවේ පුළුල් නිර්දේශය මත, රජය 2023 වසරේ දී ආනයන සීමා ඉවත් කළේය.** අඛණ්ඩව පවතින ආනයන සීමා කිරීම් මගින් ආර්ථික ක්‍රියාකාරකම් මත ඇති වන බලපෑම සලකා බලමින් මෙන්ම දේශීය විදේශ විනිමය වෙළඳපොළේ වැඩිදියුණු වීම් සහ දළ නිල සංචිත ක්‍රමයෙන් ගොඩ නැගීම පිළිබඳව හොඳින් සලකා බැලීමෙන් පසු, පුද්ගලික මෝටර් රථ හැර තාවකාලිකව අත්හිටුවන ලද භාණ්ඩ ආනයනය කිරීමේ සීමාවන් ලිහිල් කිරීමට මහ බැංකුව විසින් 2023 වසරේ මැයි මාසයේ දී

මුදල් අමාත්‍යාංශයට නිර්දේශ කරන ලදී. ඒ අනුව, තාවකාලිකව අත්හිටුවන ලද භාණ්ඩ ආනයනය කිරීම් තුළ මෝටර් රථ පමණක් පවත්වා ගනිමින්, 2023 වසරේ ජූනි, ජූලි සහ ඔක්තෝබර් මාසවල දී අදියර තුනක් යටතේ භාණ්ඩ ආනයනය කිරීමේ සීමාවන් ඉවත් කරන ලදී. ප්‍රධාන වශයෙන් විවෘත ගිණුම් ගෙවීමේ ක්‍රමය මත, 2022 වසරේ මැයි මාසයේ දී ඇතැම් ගෙවීම් ක්‍රමයන් යටතේ පනවන ලද ආනයන සීමා කිරීම්, 2023 වසර පුරාවටම අඛණ්ඩව ක්‍රියාත්මක විය. කෙසේ වෙතත්, ප්‍රතිග්‍රහණය මත ලියවිලි සහ ගෙවීම් මත ලියවිලි ගෙවීම් ක්‍රම යටතේ ආනයනය කිරීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් පූර්ව අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවය 2024 වසරේ පෙබරවාරි මස අවසානය වන විට ඉවත් කරන ලදී. මෙම ලිහිල් කිරීම් සහ රජය විසින් 2023 වසරේ මැද සිට ආනයන සීමා ලිහිල් කිරීමත් සමඟ ආනයන ක්‍රමානුකූලව ඉහළ යාම, ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් කිරීමට සහ ආනයන භාණ්ඩවල මිල මට්ටම් අඩු කිරීමට උපකාරී විය.

**2023 වසරේ දී අනුගමනය කරන ලද ඉහත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වසර තුළ විදේශීය අංශයට ඉහළ ස්ථායීතාවයක් ලබා ගැනීමට උපකාරී විය.** මෙම වෙළඳපොළ මත පදනම් වූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් රට වෙත වැඩි විදේශ විනිමය ලැබීම් ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට හේතු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ද්‍රවශීලතා තත්ත්ව සහ වෙළඳපොළ අපේක්ෂාවන් කැපී පෙනෙන ලෙස වැඩිදියුණු වීම මගින් ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අතිප්‍රමාණය විය. මෙම තත්ත්වයන් මත, දේශීය වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීමෙන් වසර තුළ දී ජාත්‍යන්තර සංචිත සැලකිය යුතු ලෙස ගොඩනගා ගැනීමට මහ බැංකුවට හැකි විය.

## 2.4 මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

### 2.4.1 සාර්ව විචක්ෂණශීලී අධිකාරිය නම් කිරීම

**මහ බැංකු පනත මගින් ශ්‍රී ලංකාවේ සාර්ව විචක්ෂණශීලී අධිකාරිය ලෙස මහ බැංකුව නම් කරන ලදී.** මූල්‍ය ස්ථායීතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා සාර්ව විචක්ෂණශීලී අරමුණු කරා ළඟා වීමේ දී බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට මෙම පනත මගින් මහ බැංකුවට බලය ලබා දී ඇත. තවද, අන්තර්මාධ්‍ය සාර්ව විචක්ෂණශීලී අරමුණු තුනක් පනතේ ප්‍රකාශ කර ඇත. අහිතකර ආර්ථික සහ මූල්‍ය තත්ත්වයන් යටතේ දී පවා මූල්‍ය සේවා සැපයීම සඳහා සහාය ලබාදෙන ආකාරයකින් මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව පවත්වාගෙන යාම, ණය සහ තෝලන අනුපාතවල තිරසර නොවන වැඩිවීම්වලින් ඇතිවන අවදානම් පාලනය කිරීම සහ මූල්‍ය පද්ධතිය තුළ අන්‍යෝන්‍ය සම්බන්ධතාවයෙන් ඇතිවන අවදානම් පාලනය කිරීම සහ පද්ධතිමය වශයෙන් වැදගත් තනි ආයතනවල අසාර්ථක වීමේ අවදානම් පාලනය කිරීම මෙම අන්තර්මාධ්‍ය අරමුණු ත්‍රිත්වය වේ. සාර්ව විචක්ෂණශීලී අධිකාරිය ලෙස මහ බැංකුව විසින් මූල්‍ය පද්ධතියේ අවදානම් සහ අන්තරායකර තත්ත්වයන්වල සැකැස්ම අධීක්ෂණය කිරීම, හඳුනා ගැනීම හෝ තක්සේරු කිරීම, සාර්ව විචක්ෂණශීලී අරමුණු ළඟා කර ගැනීම සඳහා දත්ත, තොරතුරු සහ සංඛ්‍යාන දත්ත ඉල්ලා සිටීම, රැස් කිරීම, ගොනු කිරීම, විශ්ලේෂණය කිරීම හෝ ප්‍රසිද්ධ කිරීම, ආතති පරීක්ෂණ සහ සමාකරණ අභ්‍යාස පැවැත්වීම, පද්ධතිමය වශයෙන් වැදගත් මූල්‍ය ක්ෂේත්‍ර සහභාගිකරුවන් නම් කිරීම, සාර්ව විචක්ෂණශීලී උපකරණ මහ බැංකුව විසින් නියාමනය කරන ලද සහ අධීක්ෂණය කරන ලද මූල්‍ය ආයතන සඳහා යොදා ගැනීම සහ අදාළ කර ගැනීම, හඳුනාගත් පද්ධතිමය අවදානම් අවම කිරීමට හෝ ඊට පිළියම් කිරීමට උපායමාර්ග සහ ප්‍රතිපත්ති සකස් කිරීම, නියාමනය තුළ පවතින පද්ධතිමය අවදානම් ඇති කළ හැකි හිඩැස් හඳුනා ගැනීම යනාදිය සිදු කිරීම සඳහා බලය පවරා ඇත. තව ද, මහ බැංකුවේ සෘජු අධීක්ෂණයට හෝ නියාමනයට යටත් නොවන අංශ සමඟ සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්තියට අනුකූලව මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීමට දායක වීම සහ ප්‍රතිපත්ති නිර්දේශ සම්බන්ධීකරණ ප්‍රවේශයක් සහතික කිරීමට මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව පිහිටුවීමට අදාළ වන විධිවිධාන පනත මගින් දක්වා ඇත. තවද, මහ බැංකු පනත මගින් හඳුනාගෙන ඇති ප්‍රමාණාත්මක හා ගුණාත්මක සාර්ව විචක්ෂණශීලී උපකරණවලට අමතරව, මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පරිදි නව සාර්ව විචක්ෂණශීලී උපකරණ සහ ක්‍රියාමාර්ග ද හඳුන්වා දිය හැක.

**2023 වසර තුළ දී, පද්ධතිමය අවදානම් අවම කිරීම හෝ තුරන් කිරීම සඳහා වන පුළුල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල කොටසක් ලෙස මහ බැංකුව විසින් සිය සාර්ව විචක්ෂණශීලී උපකරණ අඛණ්ඩව සූදානම් කරන ලදී.** ඒ අනුව, ගෘහස්ථ අංශය සඳහා ණය-සේවා-ආදායම් අනුපාතිකය, නිවාස ණය පහසුකම් සඳහා ණය වටිනාකම් අනුපාතික මත සීමා

සහ ප්‍රතිචක්‍රීය ප්‍රාග්ධන ස්වාරක්ෂක හඳුන්වා දීම සඳහා මහ බැංකුව විසින් ක්‍රමවේදයන් සහ රාමු සකස් කර ඇත. ණය ගැනුම්කරු මත පදනම් වූ සාර්ව විචක්ෂණශීලී උපකරණ වන ණය-සේවා-ආදායම් අනුපාතිකය සහ ණය වටිනාකම් අනුපාතිකය, අධික ණය ඉල්ලුම මැඩපැවැත්වීමට සහ බැංකුවලට සිදුවිය හැකි ණය පාඩු අවම කිරීම සහ අධික ණය බර සම්බන්ධ අවදානම් අවම කිරීම මගින් පද්ධතිමය අවදානම් ගොඩ නැගීම අවම කිරීම සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ. ප්‍රතිචක්‍රීය ප්‍රාග්ධන ස්වාරක්ෂකයෙහි අරමුණ වන්නේ මූල්‍ය පද්ධතිය ණය චක්‍රයට අනුකූලව හැසිරීම අවම කිරීමත්, එමගින් චක්‍රය ඉහළ යාමේ දී සිදුවන අධික ණය වර්ධනයෙන් බැංකු අංශය ආරක්ෂා කිරීම සහ පසුබෑමක දී ආර්ථිකයට ණය සැපයීමට පහසුකම් සැලසීමයි. මූල්‍ය පද්ධතිය සතු ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා පද්ධතිමය අසමතුලිතතාවය අවම කිරීමට අවශ්‍ය වූ විට, 2023 වසරේ දී සැලසුම් කරන ලද සාර්ව විචක්ෂණශීලී උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුව විසින් සාර්ව මූල්‍ය වර්ධනයන් සුපරීක්ෂාකාරීව අධීක්ෂණය කරනු ඇත.

### 2.4.2. බලපත්‍රලාභී බැංකුවලට අදාළ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග

**2023 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු අංශයේ සුරක්ෂිතභාවය සහ ශක්තිමත්භාවය තහවුරු කිරීම උදෙසා බලපත්‍රලාභී බැංකුවල මූල්‍ය හා මෙහෙයුම් කටයුතුවල ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරමින්, අඛණ්ඩව ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ රෙගුලාසි හඳුන්වා දෙන ලදී.** පවත්නා සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන්, බලපත්‍රලාභී බැංකුවල ද්‍රවශීලතාවයට සහ ප්‍රාග්ධන මට්ටම්වලට ඇති විය හැකි අයහපත් බලපෑම අවම කිරීමටත්, සුදුසු ද්‍රවශීලතා මට්ටම් සහ ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගැනීම සහතික කිරීමටත්, බලපත්‍රලාභී බැංකුවල තම අභිමතය පරිදි සිදුකරන ගෙවීම් සීමා කිරීම සඳහා බැංකු පනත් විධිවිධාන හඳුන්වා දෙන ලදී. එම විධිවිධානවලට අනුව, 2023 වර්ෂය සඳහා වන මූල්‍ය වාර්තා/අතුරු මූල්‍ය වාර්තාවල බාහිර විගණනය සිදු කර අවසන් කරන තුරු 2023 වර්ෂය සඳහා මුදල් ලාභාංශ ගෙවීම සහ ලාභ තම මව් රටට යැවීම ප්‍රමාද කරන ලෙසත් බලපත්‍රලාභී බැංකු වෙත දන්වා සිටින ලදී. තවද, බලපත්‍රලාභී බැංකු විසින්, 2023 වර්ෂය අවසන් වන තෙක් තම කොටස් නැවත මිලදී ගැනීමෙන්, කළමනාකරණ දීමනා සහ අධ්‍යක්ෂක මණ්ඩල ගෙවීම් ඉහළ දැමීමෙන් සහ ප්‍රාග්ධන වියදම් සිදුකරන්නේ නම් එය ඉතාමත් සුපරීක්ෂාකාරීව සහ විචක්ෂණශීලීව සිදු කරමින්, අත්‍යවශ්‍ය නොවන සහ/හෝ හදිසි නොවන වියදම් සිදුකිරීමෙන් වැළකී සිටිය යුතු ලෙස ද දන්වා සිටින ලදී. එමෙන්ම, බලපත්‍රලාභී බැංකු විසින් අත්‍යවශ්‍ය නොවන සහ/හෝ හදිසි නොවන වියදම් සහ/හෝ බැංකුව විසින් දැරිය යුතු ප්‍රාග්ධන වියදම් ඇත්නම්, ඒවා ඇගයීමට හා අනුමත කිරීමට 2023 සහ 2024 වර්ෂවලට අදාළව අධ්‍යක්ෂක මණ්ඩල මට්ටමේ අනු කමිටුවක් පිහිටුවිය යුතු වේ. තවද, බලපත්‍රලාභී බැංකු විසින් දක්වන ලද අවශ්‍යතා සපුරාලීමෙන් තොරව හා මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව විසින් නිර්දේශ කර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කිරීමකින් තොරව ප්‍රධාන විධායක නිලධාරීන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා වන කළමනාකරණ දීමනා සහ අධ්‍යක්ෂක මණ්ඩල ගෙවීම් ඉහළ දැමීමෙන් වළකින ලෙස දන්වමින් සංශෝධන ඉදිරිපත් කරන ලදී.

**බැංකුවල ද්‍රවශීලතා තත්ත්වයන්ට අදාළ ගැටලු විසඳීම සඳහා ක්ෂුද්‍ර විචක්ෂණ ක්‍රියාමාර්ග කිහිපයක් ද ක්‍රියාවට නංවන ලදී.** ඇතිවිය හැකි ද්‍රවශීලතා සීමාවීම් සහ එමගින් තනි තනි බැංකුවල සහ සමස්ත මූල්‍ය අංශයේ ස්ථායීත්වයට ඇති විය හැකි බලපෑම සමනය කිරීමට දූරදර්ශී ලෙස ක්‍රියාමාර්ග ගැනීම පිණිස බලපත්‍රලාභී බැංකුවල ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය ගණනය කිරීමේ දී බාසල් III ද්‍රවශීලතා ප්‍රමිති යටතේ බලපත්‍රලාභී බැංකු සඳහා වූ ද්‍රවශීලතා ආවරණ අනුපාතය පිළිබඳ බැංකු පනත් විධානයෙහි අර්ථ දක්වා ඇති පරිදි, සුදුසුකම් ලත් මූල්‍ය නොවන සාංගමික ණය සුරැකුම්පත් සහ සුදුසුකම් ලත් මූල්‍ය නොවන සාමාන්‍ය කොටස් ද්‍රවශීල වත්කම් ලෙස සැලකිය යුතු ලෙස දන්වමින් බැංකු පනත් නිර්ණයක් නිකුත් කරන ලදී.

**බැංකු අංශය සඳහා ඉහළ අවදානම් කළමනාකරණ පියවරක් ලෙස, තීරණාත්මක තොරතුරු පද්ධතිවල තොරතුරු ආරක්ෂාව සහ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමේ අරමුණින් වර්ෂය තුළ දී "බලපත්‍රලාභී බැංකු සඳහා තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා වන නියාමන රාමුව" පිළිබඳ බැංකු පනත් විධානයට සංශෝධන නිකුත් කරන ලදී.** එමගින්, තීරණාත්මක තොරතුරු පද්ධති හඳුනා ගැනීම, තෙවන පාර්ශ්වීය සේවා සැපයුම්කරුවන් හඳුනාගැනීම සඳහා වන අවශ්‍යතාවන්, පරිශීලක ප්‍රවේශ වරප්‍රසාද සමාලෝචන වාර ගණන, තොරතුරු පද්ධති යටිතල පහසුකම්වල හිමිකාරීත්වය සහ

කළමනාකරණය තීරණය කිරීම සඳහා තිර්ණායක යනාදිය සඳහා සංශෝධන ඉදිරිපත් කරන ලදී. තවද, තම ව්‍යාපාර/ආදායම් මාර්ග පුනර්ජීවනය කිරීමට විභවතාවක් ඇති ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ සහ පුද්ගලයන්ගේ ණය පියවීම නැවත ඇරඹීම දිරිමත් කිරීමේ අරමුණින් මූල්‍ය අංශය මත අනවශ්‍ය ආතතියක් ඇති නොවන පරිදි, පැවති සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන් වෙත බැංකු ශාඛා ජාලය හරහා අවස්ථානුකූලව සුදුසු සහන සලසන ලෙස බලපත්‍රලාභී බැංකු වෙතින් ඉල්ලා සිටින ලදී.

### 2.4.3 බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සම්බන්ධිත ප්‍රතිපත්ති

**පැවති බලපත්‍රලාභී මුදල් සමාගම්වල ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම් අනුමත කිරීමේ කාර්යාවලිය, ලාභය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය සහ කොටස්හිමි ප්‍රතිලාභ සලකා බලමින් විධිමත් කිරීමේ අරමුණින්, ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම සහ ලාභය නැවත ප්‍රේෂණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශයන් මෙම වසර තුළ නිකුත් කරන ලදී.** මෙම ක්‍රියාමාර්ගය හරහා තම පාරිභෝගිකයන්ගේ ණය අවශ්‍යතා සපුරාලීමේ හැකියාව තහවුරු කරන අතරතුර අවිනිශ්චිත කාලපරිච්ඡේදවල දී ඇතිවන ආර්ථික කම්පන දරා ගැනීමට බලපත්‍රලාභී මුදල් සමාගම්වලට ඇති හැකියාව සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම අපේක්ෂා කෙරේ.

**පසුගිය වසර කිහිපය තුළ දී දක්නට ලැබුණු අභියෝගාත්මක සාර්ව ආර්ථික වාතාවරණය හමුවේ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ පුද්ගලයින් ආරක්ෂා කරගැනීමේ අරමුණින් සහන ක්‍රියාමාර්ග ගන්නා ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයෙන් ඉල්ලා සිටින ලදී.** මෙම සහන ක්‍රියාමාර්ග මගින් තම ව්‍යාපාර හෝ ආදායම් මාර්ග හෝ පුනර්ජීවනය කිරීමට විභවතාවක් ඇති සහ එමගින් තම ණය ආපසු ගෙවීම ආරම්භ කළ හැකි ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ පුද්ගලයින් හට පහසුකම් සැලසීම ඉලක්ක කරගන්නා ලදී. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ගන්නා ලද සහන ක්‍රියාමාර්ග අතර සක්‍රිය සහ අක්‍රිය ණය ගැනුම්කරුවන්ගේ ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රතිලේඛනගත කිරීම, අක්‍රිය ණය ආපසු අය කර ගැනීමේ ක්‍රියාමාර්ග අවස්ථානුකූලව සලකා බලා අත්හිටුවීම සහ පවත්නා සක්‍රිය සහ ප්‍රතිලේඛනගත ණය කලින් පියවීම දිරිමත් කිරීම සඳහා එම ණය කලින් පියවීමේ දී අයකරනු ලබන ගාස්තු සහ අනාගත පොලී පහත හෙළීම ඇතුළත් වේ.

**2020 වසරේ දී හඳුන්වා දෙන ලද බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීම සඳහා වන වැඩපිළිවෙළ, මැදිකාලීනව ශක්තිමත්, ගතික සහ ඔරොත්තු දීමේ හැකියාව සහිත බලපත්‍රලාභී මුදල් සමාගම් බිහි කරමින් සහ එමගින් තැන්පත්කරුවන්ගේ අවශ්‍යතා සුරකිමින් සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ආරක්ෂා කරමින් ක්‍රියාත්මක වනු ඇත.** තවද, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද විධාන සහ රීතිවලට අනුකූල වීමට අසමත් සහ ඉහත බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීම සඳහා වන වැඩපිළිවෙළ සමඟ අනුගත නොවන බලපත්‍රලාභී මුදල් සමාගම් ඔවුන්ගේ බලපත්‍ර අවලංගු කිරීම මගින් වෙළඳපොළෙන් ඉවත් වීමට නියම කෙරෙනු ඇත.

**තම බලපත්‍ර අවලංගු කරන ලද හෝ අත්හිටුවන ලද හෝ සමාගම් සහ විචක්ෂණශීලී විධාන සමඟ අනුකූල නොවන සමාගම් සඳහා නියාමන සහ නිරාකරණ ක්‍රියාමාර්ග මෙම වසර තුළ කඩිනම් ලෙස ක්‍රියාත්මක කරන ලදී.** මෙම පූර්ව මැදිහත්වීම් මගින් මූල්‍ය පීඩාවන් හෝ අසමත් වීම් හෝ සිදුවීමේ හැකියාව අවම කරන ලද අතර, තැන්පතු රක්ෂණ අරමුදල මත වන අනවශ්‍ය පීඩනය පාලනය කිරීමට පහසුකම් සපයන ලදී. මේ සම්බන්ධයෙන් ගන්නා ලද නියාමන ක්‍රියාමාර්ග අතර අනුකූල නොවන බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා තැන්පතු සහ ණය ලබාගැනීම සම්බන්ධයෙන් සීමා පැනවීම, ප්‍රාථමික අලෙවිකරුවෙකුගේ ව්‍යාපාර කටයුතු අත්හිටුවීම දීර්ඝ කිරීම සහ බලපත්‍ර අවලංගු කරන ලද හෝ අත්හිටුවන ලද මුදල් සමාගම් හතරක් සඳහා වාණිජ මහාධිකරණය මගින් නිකුත් කරන ලද නියෝග ප්‍රකාරව ඇවරකරුවන් හතර දෙනෙකු පත් කිරීම ඇතුළත් විය.

### 2.4.4 රාජ්‍ය ණය කළමනාකරණ ප්‍රතිපත්ති

**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2023 ජූලි 04 වැනි දින ශ්‍රී ලංකාවේ දේශීය ණය ප්‍රශස්තකරණය (Domestic Debt Optimisation - DDO) ක්‍රියාවලිය පිළිබඳ සිය ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කරන ලදී.** දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය, ජා. මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීමේ ප්‍රයත්නයෙහි මූලික අංගයක් විය. ඒ අනුව,

**විශේෂ සටහන 5**

## ශ්‍රී ලාංකීය මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය (2024-2028): මූල්‍ය සාක්ෂරතාවයෙන් පිරිපුන් ශ්‍රී ලංකාවක් කරා

### 1. හැඳින්වීම

පුද්ගලයන්ට තම මූල්‍ය තීරණ වඩා දැනුවත් ලෙස ගැනීමට අවශ්‍ය දැනුම සහ කුසලතා පිළිබිඹු කරන මූල්‍ය සාක්ෂරතාව (Financial Literacy), ලොව පුරා පුද්ගල සහ සමාජ ආර්ථික යහපැවැත්ම තහවුරු කිරීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් ලෙස හඳුනා ගෙන තිබෙන අතර එහි වැදගත්කම විවිධ මානයන් හරහා විහිදේ. සංකීර්ණ මූල්‍ය සේවාවන් භාවිතා කිරීම, විචක්ෂණශීලී ලෙස ආයෝජන අවස්ථා තෝරා ගැනීම් සිදු කිරීම, ඵලදායී ලෙස ණය කළමනාකරණය කිරීම සහ අනාගත මූල්‍ය ස්ථාවරත්වය වෙනුවෙන් සැලසුම් කිරීම සඳහා පුද්ගලයන් සවිබල ගැන්වීම මගින් ඔවුන්ගේ ආර්ථික තත්ත්වයන්ට බලපෑම් සිදු කිරීමට මූල්‍ය සාක්ෂරතාවයට හැකිවේ (Lone & Bhat 2022). පුද්ගල මූල්‍ය යහපැවැත්මෙන් ඔබ්බට යමින් දැනුවත් පාරිභෝගික හැසිරීම් දිරිමත් කිරීම, මූල්‍ය වෙළඳපොළවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, පද්ධතිමය අවදානම් (Systemic Risks) අවම කිරීම, මූල්‍ය අන්තර්ගතභාවය (Financial Inclusion) ප්‍රවර්ධනය කිරීම සහ තිරසාර ආර්ථික වර්ධනයට සහාය වීම යනාදිය මගින් සාර්ව ආර්ථික වටපිටාව හැඩගැස්වීම සඳහා ද මූල්‍ය සාක්ෂරතාවය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි (Lusardi & Mitchell 2013).

### 2. මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම පිළිබඳ ගෝලීය උපදේශනය, පළපුරුද්ද සහ ශ්‍රී ලංකාව සඳහා එහි අදාළත්වය

ජාතික මූල්‍ය සාක්ෂරතා මට්ටම් ඉහළ නැංවීම සඳහා වන ගෝලීය උපදේශනය බහුවිධ ප්‍රයත්නයක් වන අතර එය, නව්‍ය මූල්‍ය සාක්ෂරතා උපාය මාර්ග මෙන්ම (Innovative Strategies), මූල්‍ය සාක්ෂරතාව වෙනුවෙන් වන වෘත්තීයමය සන්ධාන සහ තිරසාර සංවර්ධනය සඳහා කැපවීම යන අංශයන්ද පිළිබිඹු කරයි. ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය (OECD), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා ආයතනය (IFC) සහ මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වූ සන්ධානය (AFI) වැනි ආයතන, මේ සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන් සැකසීමේදී මෙන්ම, තම මූල්‍ය අධ්‍යාපන රාමු වැඩිදියුණු කිරීම අරමුණු කරගත් රටවලට මාර්ගෝපදේශ, සම්පත් සහ සහාය සැපයීමේදී ද ප්‍රධාන භූමිකාවන් ඉටු කරයි.

සමස්තයක් වශයෙන් මෙම ආයතන විසින්, සාමාන්‍ය ජනතාවගේ, විශේෂයෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල විවිධ අවශ්‍යතා සපුරාලීමට හැකි පරිදි සකස් කරන ලද, ඉලක්කගත සහ සියලු දෙනා අන්තර්ගත මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්වල වැදගත්කම අවධාරණය කරයි (AFI 2021; OECD 2005). මේ සඳහා යොදාගත හැකි පරිපූර්ණ මෙවලමක් ලෙස, ජාතික මූල්‍ය සාක්ෂරතා උපාය මාර්ග හෝ මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශ (Financial Literacy Roadmaps), රජයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් හඳුනා ගෙන තිබෙන අතර, ඉහළ මූල්‍ය සාක්ෂරතා මට්ටම් හරහා වැඩිදියුණු කළ මූල්‍ය අන්තර්ගත මට්ටම් ළඟා කර ගැනීමේ ධනාත්මක වෙනසක් ඇති කිරීම සඳහා මෙම උපාය මාර්ග යොදා ගැනේ (World Bank 2014).

මේ අනුව ගත් කල, ශ්‍රී ලංකාවේ වර්තමාන පසුබිම තුළ, මෙවැනි ජාතික මට්ටමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම තුළින් සැලකිය යුතු ඉහළ මට්ටමක, බහුවිධ වාසි ලබා ගත හැකි වේ. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත හඳුන්වා දීමත් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමේ නෛතික වගකීම පැවරී තිබේ. මේ අනුව, වඩාත් පුළුල්ව ගත් කළ, ඉහළ මූල්‍ය සාක්ෂරතාවක් හරහා ඉහළ මූල්‍ය අන්තර්ගත මට්ටමක් කරා ළඟා වීමට වඩාත්ම සුදුසු මෙවලම ලෙස ජාතික මට්ටමේ මූල්‍ය සාක්ෂරතා මුලපිරීමක් (Financial Literacy Initiative) සැලකිය හැකිය.

### 3. ශ්‍රී ලංකාවේ වත්මන් මූල්‍ය සාක්ෂරතා පසුබිම

ශ්‍රී ලංකාවේ මූල්‍ය සාක්ෂරතා පසුබිම හඳුනා ගැනීම සඳහා, 2021 වසරේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා ආයතනය (IFC) සමඟ එක්ව ශ්‍රී ලංකාවේ ප්‍රථම ජාතික මූල්‍ය සාක්ෂරතා සමීක්ෂණය, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයේ (NFIS) ක්‍රියාකාරී සැලැස්ම යටතේ සිදු කරන ලදී.

මූල්‍ය සාක්ෂරතා සමීක්ෂණයේ ප්‍රතිඵලවලට අනුව, සැසඳිය හැකි සමීක්ෂණ ප්‍රතිඵල සහිත අනෙකුත් රටවල් හා සසඳන විට ශ්‍රී ලාංකිකයන්ගේ මූල්‍ය දැනුම සතුටුදායක මට්ටමක පවතින නමුත් ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ දැඩි අවධානයට ලක් විය යුතු මට්ටමක් දක්වා මූල්‍ය හැසිරීමේ පසුබෑමක් නිරීක්ෂණය විය. මූල්‍ය දැනුම, සැබෑ මූල්‍ය හැසිරීම බවට පරිවර්තනය කිරීම යනු මූල්‍ය ආකල්පවල ගැටලු, හැසිරීම් නැඹුරුතා (Behavioural Biases), ප්‍රායෝගික අත්දැකීම් නොමැතිකම, සමාජ ආර්ථික බාධක සහ චිත්තවේගීය සාධක (Psychological Factors) වැනි හේතු රාශියකින් පැන නගින බහුමාන ගැටලුවකි. මෙම සාධකවල සමස්ථ බලපෑම නිසා මූල්‍ය දැනුම සහ සැබෑ මූල්‍ය හැසිරීම අතර පරතරය පුළුල් වන අතර, පුද්ගලයන් විසින් තම මූල්‍ය දැනුම ප්‍රායෝගිකව හා ඵලදායී ලෙස භාවිත කිරීම අභියෝගාත්මක කටයුත්තක් බවට පත් වේ. අයහපත් මූල්‍ය හැසිරීම් මගින් පුද්ගලයන්ගේ ආර්ථික කම්පනවලට ගොදුරු වීමේ අවදානම තීව්‍ර කරන අතර අඩු ඉතුරුම් සහ ඉහළ ණය මට්ටම් හරහා සාර්ව ආර්ථික අස්ථාවරත්වයට දායක වීම, අසමානතාවය (Inequality) ඉහළ නැංවීම මෙන්ම රජයේ ආධාර වැඩසටහන් මත යැපීම් ඉහළ යාම හේතුවෙන් පොදු සම්පත්වලට බලපෑම් සිදුවීම වැනි අහිතකර තත්ත්වයන් ද ඇතිවේ.

තව ද, ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවයේ දී ස්ත්‍රී හා පුරුෂ පරතරයක් නිරීක්ෂණය නොවුනද, මූල්‍ය සාක්ෂරතා මට්ටම්වල දී සාමාන්‍ය මට්ටමේ ස්ත්‍රී, පුරුෂ පරතරයක් නිරීක්ෂණය විය (CBSL 2021a; 2021b). මෙම පරතරය අඩු කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සංවේදී ප්‍රවේශයන් (Gender Sensitive Approaches) හඳුන්වා දිය යුතුය. මේ අනුව, මූල්‍ය සාක්ෂරතාව එනම් මූල්‍ය දැනුම සහ කුසලතා, ශ්‍රී ලාංකිකයන්ගේ ධනාත්මක මූල්‍ය හැසිරීම් බවට පරිවර්තනය කිරීමට සහාය වීම සඳහා ඉලක්කගත, චර්යාත්මක මැදිහත්වීම් (Targeted Behavioural Interventions) හඳුන්වාදීම වත්මන් පසුබිම තුළ ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවයක් ලෙස සැලකිය යුතුය.

### 4. ශ්‍රී ලාංකීය මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය

2021 මූල්‍ය සාක්ෂරතා සමීක්ෂණයේ සොයාගැනීම් මත පදනම්ව, මූල්‍ය අංශයේ නියාමකයින්, අමාත්‍යාංශ, විද්වතුන් සහ අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන ඇතුළුව පාර්ශ්වකරුවන් 40කට අධික සංඛ්‍යාවක් සමඟ සහයෝගයෙන් ශ්‍රී ලංකාව සඳහා වූ ප්‍රථම "මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය" හඳුන්වා දීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කටයුතු කරන ලදී.

### 5. මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලාංකිකයන්ගේ මූල්‍ය හැසිරීම් වැඩිදියුණු කිරීමේ මූලික අරමුණ ඇතිව 2024 සිට 2028 දක්වා ක්‍රියාත්මක කිරීමට නියමිත වසර 05ක ක්‍රියාකාරී සැලැස්මකින් මෙම මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය සමන්විත වේ. දැනට මෙම ක්‍රියාකාරී සැලැස්ම, මාර්ගෝපදේශයෙහි උපායමාර්ගික ප්‍රමුඛතා 04ක් හරහා අරමුණු 10ක් ළඟා කර ගැනීම සඳහා ගොඩ නංවා ඇති ක්‍රියාමාර්ග 48කින් සමන්විත වේ.

මෙම ක්‍රියාමාර්ග හරහා ප්‍රධාන වශයෙන් අවධානය යොමුවන්නේ පවත්නා සම්පත් ඵලදායී ලෙස භාවිතා කරමින්, සම්බන්ධීකරණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම, පාර්ශ්වකරුවන් විසින් භාවිතා කරන මූල්‍ය සාක්ෂරතා සම්පත් ප්‍රමිතිගත කිරීම, ජාතික මට්ටමේ රාජ්‍ය හා පෞද්ගලික අධ්‍යාපන හවුල්කරුවන්ගේ සහයෝගීතාවය ලබා ගෙන පාසල් දරුවන් පාසලෙන් පිටවන අවස්ථාව වන විට මූල්‍යමය හැකියාව ඇති පුද්ගලයන් බවට පත් කිරීමට සහාය වීම, වැනි කරුණු පිළිබඳව ය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථාපිත මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයෙහි ලේකම් කාර්යාලය මෙම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සහය දක්වනු ඇත. මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයෙහි දැනට

**ශ්‍රී ලාංකීය මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි ප්‍රතිපත්ති රාමුව (2024-2028)**

| | |
|---|---|
| **දැක්ම** | "මූල්‍ය සාක්ෂරතාවෙන් පිරිපුන් ශ්‍රී ලංකාවක්" |
| **මෙහෙවර** | ජනතාවගේ මූල්‍ය යහපැවැත්ම ඉහළ නැංවීම සඳහා හොඳින් දැනුවත් සහ වගකිවයුතු මූල්‍ය තීරණ ගැනීමට අවශ්‍ය මූල්‍ය දැනුම, කුසලතා සහ විශ්වාසය සමඟින් ඉහළ මූල්‍ය අන්තර්ග්‍රහණයක් කරා සියලුම ශ්‍රී ලාංකිකයන් සවිබල ගැන්වීම. |
| **උපායමාර්ගික ප්‍රමුඛතා** | (i) ඵලදායී සම්බන්ධීකරණය සහ විෂය කරුණු සුසංයෝජනය (Effective Coordination and Harmonised Content)<br>(ii) ඉහළ මට්ටමේ ධනාත්මක මූල්‍ය හැසිරීම් (Increased Positive Financial Behaviour)<br>(iii) සුපරීක්ෂාකාරී සහ ආරක්ෂිත මූල්‍ය පාරිභෝගිකයින් (Vigilant and Protected Financial Consumers)<br>(iv) නවමු වෙනසකින් යුතු අනාගත පරපුරක් (Generational Behaviour Change) |
| **ඉලක්කගත කණ්ඩායම්** | (i) තරුණ පිරිස් සහ පාසල් දරුවන්<br>(ii) අවදානමට ලක්විය හැකි ලෙස හඳුනාගත් ජන කොටස් (කාන්තා, විදේශ ශ්‍රමිකයන් ආදිය)<br>(iii) ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් (MSMEs)<br>(iv) වෘත්තීයවේදීන් සහ රජයේ සේවකයන් |
| **ප්‍රධාන අන්තර්ගතය** | (i) ආර්ථික හා මූල්‍ය පරිසරය<br>(ii) ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාව<br>(iii) මූල්‍ය කළමනාකරණය<br>(iv) පාරිභෝගික ආරක්ෂණය |

පවත්නා පරිපාලන ව්‍යුහය මගින් මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි නිසි ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කරනු ලබයි.

මෙවැනි ජාතික මට්ටමේ මූල්‍ය සාක්ෂරතා මුලපිරීම් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ආර්ථිකයේ වෙනස්වන සුළු, ගතික මූල්‍ය සාක්ෂරතා අවශ්‍යතාවලට අනුව යාවත්කාලින වීම ඉතා වැදගත් වේ. මේ අනුව, මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි ක්‍රියාකාරී සැලැස්ම, එවැනි අවශ්‍යතා සපුරාලීම සඳහා යාවත්කාලීන කළ හැකි ලේඛනයක් වනු ඇත.

**6. ඉදිරි දැක්ම**

ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ සුවිශේෂී කැපවීම සහ සාර්ථක මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයක් කෙටුම්පත් කිරීම වැනි සාධනීය කරුණු මෙන්ම ධනාත්මකව භාවිත කල හැකි ප්‍රශස්ත අවස්ථාවන් පවා දක්නට හැකි වුවද, මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි ඉදිරිය, අභියෝග වලින් පිරුණු මාර්ගයක් වනු ඇත. ජාතික ප්‍රතිපත්ති සමඟ පෙළගැස්වීම, විකාශනය වන මූල්‍ය පරිසරය සහ ගෝලීය ප්‍රවණතාවලට අනුවර්තනය වීම, පහසු ප්‍රවේශයක් සහිත මෙන්ම සියල්ලන් ඇතුළත් මූල්‍ය සාක්ෂරතා මැදිහත් වීම් (Financial Literacy Interventions) නිර්මාණය කිරීම, හවුල්කාරිත්වයන් පවත්වාගෙන යාම, සහ ඵලදායී අධීක්ෂණ සහ ඇගයීම් රාමු ස්ථාපිත කිරීම වැනි තීරණාත්මක සාධක ගණනාවක් මත මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි සාර්ථකත්වය රඳා පවතී. මෙම සාධක, මූල්‍ය සාක්ෂරතා මැදිහත් වීම් වල ධනාත්මක බලපෑම සහ තිරසාරත්වය උපරිම ලෙස තහවුරු කරමින් මූල්‍ය සාක්ෂරතාවයෙන් පිරිපුන් සවිබල ගැන්වූ ප්‍රජාවක් ඇති කිරීම සඳහා තීරණාත්මක ලෙස දායක වේ. එපමණක් නොව, වර්තමාන මූල්‍ය දැනුම සහ කුසලතා මට්ටම්, මූල්‍ය සේවා සඳහා පවතින පුළුල් ප්‍රවේශය සහ ඩිජිටල් තාක්ෂණයේ ඉහළ භාවිතය, වැනි දැනට පවතින සම්පත් උපරිම ලෙස භාවිත කිරීම තුලින්, මූල්‍ය සාක්ෂරතා මැදිහත් වීම්වල බලපෑම උත්ප්‍රේරණය කළ හැකිය.

මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය යටතේ, මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රජා සෞඛ්‍ය ජාලය, කාන්තා සංවර්ධන නිලධාරිනියන්ගේ, ගොවිජන හා සමෘද්ධි සමිති වැනි දැනටමත් ස්ථාපිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ මාර්ග සහ ජාල (Delivery Channels and Networks) උපයෝගී කර ගනිමින් දැනට පවත්නා සම්පත් උපරිම ලෙස භාවිත කරනු ඇත. තවද, ජාතික මට්ටමේ පාර්ශවකරුවන් 40කට වැඩි පිරිසකගේ සහභාගීත්වයෙන් යුතු මෙම මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි ප්‍රවේශය සැලකිය යුතු ලෙස පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙහි ඵලදායීබව සහ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ දීර්ඝ කාලීන කැපවීම අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන්ම, මෙම මාර්ගෝපදේශය, මෙවැනි ජාතික ප්‍රයත්නයක් සිදු කරන පළමු අවස්ථාව හෙයින් බහුපාර්ශ්වික සංවර්ධන හවුල්කරුවන්ගේ කැපවීම හරහා, ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික සහ මූල්‍ය ආධාර ලබාගැනීම සිදු වනු ඇත.

මේ අනුව මෙම මාර්ගෝපදේශය සාර්ථක කර ගැනීම සඳහා පාර්ශ්වකරුවන් විසින් එක්ව ගනු ලබන ප්‍රයත්නයන් ඉතා වැදගත් වන හෙයින් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය අභියෝගාගත්මක වේ. ජාතික මට්ටමේ වැඩසටහනක් ලෙස, පුළුල් ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති සමඟ මාර්ගෝපදේශය පෙළ ගස්වා ගනිමින් ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දීම සහතික කිරීම සඳහා රජය, මූල්‍ය ආයතන සහ අධ්‍යාපනඥයින් ඇතුළු ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර ඵලදායී සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ. ඉලක්කගත කණ්ඩායම් වල විවිධ අවශ්‍යතා නිසි ලෙස හඳුනා නොගැනීම, මූල්‍ය නවෝත්පාදනයන්හි වේගවත් ප්‍රගතියට සමගාමීව මාර්ගෝපදේශය යාවත්කාලීන නොකිරීම, ඉලක්කගත කණ්ඩායම්වල ඵලදායී නියැලීම සහ නිසි ප්‍රවේශය සහතික කිරීමට අපොහොසත්වීම වැනි කරුණු මාර්ගෝපදේශය ඵලදායී ලෙස ක්‍රියාත්කම කිරීමට තර්ජනයක් විය හැකිය.

මේ අනුව, මූල්‍ය වංචාවන්ට එරෙහිව ඵලදායී ලෙස සටන් කිරීම, අධික ණයගැතිභාවය තුරන් කිරීම, දිළිඳුකම පිටු දැකීම සහ දරිද්‍රතා උගුල් බිඳ හෙළීම වැනි දේ හරහා ඉහළ ආර්ථික සහ සමාජ වාසි ළඟා කර දීමට නිසැක හැකියාවක් ඇති මෙම මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය අඛණ්ඩව සහ සාර්ථකව ඉදිරියට ගෙන යාම සඳහා සියලුම පාර්ශවකරුවන් විසින් ඉහළ අවධානයක් ලබා දිය යුතු බව පැහැදිලිය. තවද, මෙම මාර්ගෝපදේශය හරහා පුද්ගලික සහ ජාතික මට්ටමේ ඉතුරුම් සහ ආයෝජන වැඩි වශයෙන් දිරිමත් කරන අතර එමගින් අභ්‍යන්තර ප්‍රාග්ධන ගොඩනැංවීම දිරිමත් කරමින් ආර්ථික වර්ධනයට පහසුකම් සලසනු ඇත.

---

මූලාශ්‍ර


1. Alliance for Financial Inclusion (2021) National Financial Education Strategies Toolkit Available at https://www.afi-global.org/wp-content/uploads/2021/07/NFES_toolkit_22082022.pdf
2. Annamaria Lusardi and Olivia S. Mitchell (2013) "The Economic Importance of Financial Literacy: Theory and Evidence", Journal of Economic Literature, American Economic Association, vol. 52(1), pages 5-44, Available at http://www.nber.org/papers/w18952
3. CBSL (2021a), National Financial Inclusion Strategy of Sri Lanka: "Better Quality Inclusion for Better Lives" Available at https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2021/en/13_Box_10.pdf
4. CBSL (2021b) Financial Literacy Survey – Sri Lanka – 2021 https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/financial_literacy_servey_sri_lanka_2021_e.pdf
5. OECD (2005) Recommendation on Principles and Good Practices for Financial Education and Awareness, Available at https://www.oecd.org/finance/financial-education/35108560.pdf
6. Umer Mushtaq Lone and Suhail Ahmad Bhat (2022) "Impact of financial literacy on financial well-being: a mediational role of financial self-efficacy, Journal of Financial Services Marketing", Volume 29, pages 122–137 , Available at https://doi.org/10.1057/s41264-022-00183-8.
7. World Bank (2014) Financial Education Programs and Strategies; Approaches and Available Resources, Available at https://documents1.worldbank.org/curated/en/901211472719528753/pdf/108104-BRI-FinancialEducationProgramsandStrategies-PUBLIC.pdf

**2.1 සංඛ්‍යා සටහන** **දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලියෙහි සාරාංශය**

| අයිතමය | ක්‍රියාත්මක කළ දිනය | ප්‍රශස්තකරණයට අදාළ වටිනාකම (රුපියල් බිලියන) |
|---|---|---|
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 2023 අගෝස්තු 15 | 252 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 2023 සැප්තැම්බර් 14 | 3,204 |
| මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් සහ මහ බැංකුව විසින් රජයට ලබාදෙන ලද තාවකාලික අත්තිකාරම් | 2023 සැප්තැම්බර් 21 | 2,713 |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

සුදුසුකම් ලත් හිමිකරුවන් සතු සුදුසුකම් ලත් භාණ්ඩාගාර බැඳුම්කර, මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්, මහ බැංකුව විසින් ශ්‍රී ලංකා රජයට ලබා දුන් තාවකාලික අත්තිකාරම්, තනි පුද්ගල ආයෝජකයන් හැර අනෙකුත් ආයෝජකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ රජය විසින් දේශීය නීතිය යටතේ නිකුත් කරන ලද විදේශ විනිමය බැංකු ණය, සුදුසු පරිදි දිගුකාලීන භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කිරීම හෝ හුවමාරු කිරීම සිදු කරන ලදී. මෙම ප්‍රශස්තකරණ ක්‍රියාවලිය අදියර කිහිපයක් යටතේ ක්‍රියාත්මක විය. පියවීමට තිබූ සියලුම ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, 2023 නොවැම්බර් මස අවසානය වන විට පරිවර්තනය කිරීම හෝ සම්පූර්ණයෙන් පියවා අවසන් කිරීම සිදු කරන ලදී. දේශීය නීතිය යටතේ නිකුත් කරන ලද ඉතිරිව පවතින විදේශ විනිමය බැංකු ණය ප්‍රතිව්‍යුහගත කිරීම මේ වන විට සිදුවෙමින් පවතී. කෙටි හා මධ්‍ය කාලීනව රජයට අත්‍යවශ්‍යව තිබූ මූල්‍ය අවකාශය නිර්මාණය කිරීමට දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය උපකාරී විය. ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් මෑත කාලීනව සිදු කළ ණය ශ්‍රේණිගත කිරීමේ ඇගයීම්වල දී ශ්‍රී ලංකාවේ දේශීය මුදලින් නාමනය වූ වගකීම් සම්බන්ධයෙන් වාර්තා කළ සිය ඉදිරි දැක්ම තුළින් ද දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය අවසන් කිරීමෙන් පසු ඇති වූ මෙම වර්ධනයන් හඳුනා ගෙන ඇත. මේ අතර, විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සඳහා රජයට සහ ඒ සඳහා පත් කරන ලද මූල්‍ය හා නීති උපදේශකයින්ට අවශ්‍ය සහයෝගය අඛණ්ඩව ලබා දීමට මහ බැංකුව කටයුතු කළේය.

### 2.4.5 මූල්‍ය අන්තර්ගතභාවය සඳහා ප්‍රතිපත්ති

**නව මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමග ම, සියලු දෙනාටම ප්‍රතිලාභ හිමි තිරසාර මූල්‍ය පද්ධතියක ඇති අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන, ශ්‍රී ලංකාව තුළ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම, ප්‍රාදේශීය සංවර්ධනයට අදාළ මහ බැංකුවේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයක් ලෙස ඉස්මතු වී ඇත.** මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයෙහි ක්‍රියාකාරි සැලැස්ම එහි පාර්ශ්වකරුවන් සමඟ සාර්ථක ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී. මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයෙහි පළමු අදියර 2024 වර්ෂයේ දී අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන අතර ඊට සමගාමීව මූල්‍ය සාක්ෂරතාවයෙන් හෙබි ප්‍රජාවක් ඇති කිරීම උදෙසා වූ මූල්‍ය සාක්ෂරතා පෙරදැක්ම ඉදිරියේ දී දියත් කෙරෙනු ඇත.

**නව මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමඟ, රජය හා අනුග්‍රාහක අරමුදල් මගින් ක්‍රියාත්මක වූ ණය යෝජනා ක්‍රම අවසන් කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයකට එළඹිය ද, දැනට ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ණය යෝජනා ක්‍රම ඒවායේ අවසන් අදියර දක්වාම ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරන ලදී.** කුඩා පරිමාණ වගාකරුවන්ගේ සහ තරුණ ව්‍යවසායක ප්‍රජාවගේ අරමුදල් අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, ණය යෝජනා ක්‍රම කිහිපයක මෙහෙයුම් කාලසීමාව වසර තුළ දී දීර්ඝ කරන ලදී. රජය වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රම හරහා ලබාදෙනු ලබන ප්‍රතිලාභ වැඩි පිරිසක් වෙත ලබාදීමේ අරමුණින් ප්‍රජා මූලික මූල්‍ය අතරමැදියන්ගේ අර්ථ දැක්වීමේ වපසරියත් පුළුල් කිරීමේ ණය යෝජනා ක්‍රම කිහිපයක ම මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. තවද, විදෙස්ගත ශ්‍රමිකයන් විසින් මෙරටට එවන විදේශ විනිමය ඉපයීම් විධිමත් මාර්ගයන් ඔස්සේ පමණක් ප්‍රේෂණය කිරීම දිරිමත් කරමින්, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ 2023 වසරේ දී ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයන් සඳහා ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

### 2.4.6 ගෙවීම් සහ පියවීම් පද්ධති සඳහා වන ප්‍රතිපත්ති

**ගෙවීම් පද්ධතිවල ආරක්ෂාව හා ස්ථාවරත්වය සහතික කරමින් ඩිජිටල් ගෙවීම් ක්‍රම ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විවිධ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මෙම වසර තුළ ක්‍රියාත්මක කරන ලදී.** රට තුළ ක්‍රියාත්මක වන ක්ෂණික ගෙවීම් පද්ධතිය වන විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (Common Electronic Fund Transfer Switch - CEFTS) හරහා සිදු කෙරෙන ගනුදෙනු සඳහා අවධානය යොමු කරමින් ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධනය සහ වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සිය උත්සාහය අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. ඒ අනුව, විශාල

2

ගනුදෙනු ප්‍රමාණයකට පහසුකම් සැලසීමේ අරමුණින් CEFTS පද්ධතියට අදාළ වන බහු ස්ථර වගකීම් කළමණාකරන සීමාවන් සංශෝධනය කරන ලදී.

**රාජ්‍ය ආයතනවලට මහජනතාව විසින් සිදු කරන ගෙවීම් මාර්ගගත ක්‍රමයට සිදු කිරීම සඳහා පහසුකම් සැලසීමට ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව (LankaPay Online Payment Platform - LPOPP) සමඟ සම්බන්ධ වන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත උපදෙස් ලබා දෙන ලදී.** මීට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව, ලංකාපේ ආයතනය විසින් ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව හරහා පහසුකම් සපයන රජයේ ඩිජිටල් ගෙවීම් වේදිකාව (Government Digital Payment Platform - GDPP) හා සම්බන්ධ වන ලෙස බලපත්‍රලාභී බැංකුවලට උපදෙස් ලබා දුන්නේය. මෙම ඒකාබද්ධතාවය මගින් දැනට අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ පද්ධතිවලින් තොර රාජ්‍ය ආයතනවලට, විශේෂයෙන් පළාත් පාලන ආයතන වෙත, මහජනතාවගෙන් ඩිජිටල් ගෙවීම් භාරගැනීමට හැකියාව ලැබෙනු ඇත.

**දුර බැහැර ප්‍රදේශවල ඩිජිටල් ගනුදෙනු ප්‍රවර්ධනය කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනුදෙනු සහ ප්‍රේෂණ සඳහා විද්‍යුත් මුදල් සේවා භාවිතය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී.** මෙම ක්‍රියාමාර්ග මගින් මූලික (basic) සහ වැඩි දියුණු කරන ලද (enhanced) විද්‍යුත් මුදල් පසුම්බි සඳහා අවසර දී ඇති උපරිම වටිනාකම ඉහළ නංවන ලදී. මෙමගින් දුර බැහැර ප්‍රදේශවල වෙසෙන පුද්ගලයන් සඳහා වැඩි මූල්‍ය අන්තර්ග්‍රහණයක් සහ ගනුදෙනු සිදු කිරීම පහසු කිරීම ප්‍රවර්ධනය කිරීම සහ ඩිජිටල් ගෙවීම් ක්‍රම අනුගමනය කිරීමට ධෛර්යමත් කිරීම අරමුණු කරයි. තවද, අවම පිරිවැයක් යටතේ ඩිජිටල් මාධ්‍යයෙන් සිදු කරන ගෙවීම් පිළිගැනීමට සුළු හා මධ්‍ය පරිමාණ වෙළඳුන් දිරිමත් කිරීම සඳහා LANKAQR වෙළඳ වට්ටම් අනුපාතය (Merchant Discount Rate - MDR) සියයට 0.5ක් ලෙස පවත්වා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරන ලදී.

**ශ්‍රී ලංකාවට විවිධ රටවලින් පැමිණෙන සංචාරකයින්ගේ දේශ සීමා හරහා සිදු කෙරෙන සුළු පරිමාණ ගෙවීම් සඳහා පහසුකම් සැලසීමට, චීනයේ සහ ඉන්දියාවේ ගෙවීම් ජාලයන් සමඟ ඒකාබද්ධ වීම සඳහා ජාතික ගෙවීම් ජාල ක්‍රියාකරු වන ලංකාපේ (පුද්ගලික) සමාගම වෙත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමැතිය ලබා දෙන ලදී.** මෙම ඒකාබද්ධ කිරීම් මගින් චීනයේ සහ ඉන්දියාවේ සංචාරකයින්ට ශ්‍රී ලංකාවේ LANKAQR කේත ඇති ව්‍යාපාරිකයින් වෙත ගෙවීම් කිරීමට ඉඩ සලසයි. ශ්‍රී ලාංකික වෙළඳුන් විසින් ඉන්දියාවේ සහ චීනයේ මූල්‍ය ආයතන වෙත ගෙවිය යුතු ඉහළ අන්තර් හුවමාරු ගාස්තුව සමතුලිත කිරීම සඳහා සම තත්ත්වයක් නිර්මාණය කිරීමේ අරමුණින්, මෙම විදේශීය ගෙවීම් යෙදුම් හරහා කරන LANKAQR ගනුදෙනු සඳහා ගනුදෙනුවක වටිනාකමට උපරිම වෙළඳ වට්ටම් අනුපාතයක් (MDR) තීරණය කර ඇත.

**ඩිජිටල් ගනුදෙනුවල සමස්ත ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ ඩිජිටල් ගෙවීම් ක්‍රම වැඩි වශයෙන් අනුගමනය කිරීම දිරිමත් කිරීමේ අරමුණින් ඩිජිටල් ගෙවීම්වල සුරක්ෂිතභාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පියවර කිහිපයක් දියත් කරන ලදී.** හර සහ බැර ගනුදෙනු සඳහා තත්කාලීන දැනුම්දීම් අනිවාර්ය කිරීම මෙන්ම ඩිජිටල් මාධ්‍යන් හරහා සිදු කරන ණය කාඩ්පත් පියවීම් එසැණින් යාවත්කාලීන කිරීම් මෙම ක්‍රියාමාර්ගවලට ඇතුළත් වේ. මීට අමතරව, ඩිජිටල් ගනුදෙනුවක් සිදු කිරීමේ දී ප්‍රතිලාභියා වෙත යොමු කෙරෙන විස්තරය අනිවාර්ය කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවලට උපදෙස් ලබා දුන් අතර, බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන්ට, ගනුදෙනුකරුවන්ගෙන් වෙළඳ වට්ටම් අනුපාතය අය නොකරන ලෙස තම වෙළඳුන්ට උපදෙස් දෙන ලෙස දැනුම් දෙන ලදී. JustPay ගනුදෙනු සඳහා පහසුකම් සපයන ජංගම ගෙවීම් යෙදුම් මගින් ගනුදෙනු මුදල රුපියල් 10,000/- සීමාවට සමාන හෝ එය ඉක්මවා ගියහොත්, සම්බන්ධිත ගිණුමේ නිකුත් කරන්නාගෙන් එක වරක් භාවිතා කළ හැකි මුරපදයක් (OTP) ඉල්ලා සිටිය යුතු බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලදී. JustPay පහසුකම සහිත ගෙවීම් යෙදුම් පරිශීලකයින්ට ඕනෑම මූල්‍ය ආයතනයක තම ගිණුම් ඔවුන්ගේ ජංගම ගෙවීම් යෙදුමට සම්බන්ධ කිරීමට සහ මෙම සම්බන්ධිත ගිණුම්වලින් අරමුදල් නැවත ලබා ගැනීමෙන් ගෙවීම් කිරීමට ඉඩ සලසා දෙනු ලැබේ.

### 2.4.7 මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

2023 වසරේ දී, මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශවලට අනුකූලව, මෙරට මුහුණ දෙන මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ අවදානම් හඳුනා ගැනීමේ, තක්සේරු කිරීමේ සහ වඩා හොඳින් අවබෝධ කර ගැනීමේ අරමුණින් මූල්‍ය බුද්ධි ඒකකය විසින් සම්බන්ධීකරණය කරන ලද 2021/22 මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ ජාතික අවදානම් ඇගයීම අවසන් කරන ලදී. මෙම ජාතික අවදානම් ඇගයීම මගින්

**විශේෂ සටහන 6**

## ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව සම්බන්ධයෙන් වූ අන්‍යෝන්‍ය ඇගයීම 2025: එහි ජාතික වැදගත්කම

2

### 1. හැඳින්වීම

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම, ලොව මූල්‍ය පද්ධති වලට මෙන්ම ජාතික ආරක්ෂාවට සහ ආර්ථික ස්ථාවරත්වයට ද සැළකිය යුතු අභියෝගයකි. එමෙන්ම, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම, ආර්ථිකමය සහ සමාජීය වශයෙන් දුබලතා මතු කරමින් ලොව පුරා රටවලට බලපෑම් කරනු ලැබේ. දුර්වල පරිපාලනය සහ අල්ලස් හෝ දූෂණය හේතුවෙන් ඇතැම් රටවල් මේ සම්බන්ධයෙන් ඉහළ අවදානමකට ලක්ව ඇති අතර, කිසිදු රටක් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම හා සම්බන්ධ අවදානම් වලින් සම්පූර්ණයෙන්ම නිදහස් නොවේ. ලොව පුරා මූල්‍ය අපරාධ වල ඉහළ යාමේ නැඹුරුතාවය සැළකිල්ලට ගනිමින්, මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිව සටන් කිරීම ගෝලීය ප්‍රමුඛතාවක් බවට පත්ව ඇත. මේ සඳහා මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීමට සහ මෙම අපරාධයන්ට සම්බන්ධ අවදානම්වලට එරෙහිව සටන් කිරීමට රජයන් සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන, මූල්‍ය ආයතන, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්, හා ජාත්‍යන්තර සංවිධාන අතර සහයෝගීතාව අත්‍යවශ්‍ය වේ.

මූල්‍ය කාර්ය සාධක බලකාය (Financial Action Task Force - FATF), මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ගෝලීය ප්‍රතිපත්ති සම්පාදක ලෙස ගෝලීය ප්‍රමිතීන් ස්ථාපිත කිරීම සහ ජාතීන් අතර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම මගින් මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිව සටන් කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

මූල්‍ය කාර්ය සාධක බලකාය සහ කලාපීය මූල්‍ය කාර්ය සාධක බලකා අනුරූපී නිරීක්ෂණ ආයතන විසින් රටක් මූල්‍ය කාර්ය සාධක බලකායේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට දක්වනු ලබන අනුකූලතාව සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ පියවරයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන්නේ ද යන්න ඇගයීම සඳහා ගනු ලබන ක්‍රියාකාරී පියවරක් ලෙස අන්‍යෝන්‍ය ඇගයීම් සිදු කරයි. සාමාජික රටවල ජාතික පද්ධතීන්වල පවතින දුර්වලතා මෙන්ම මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව තුළ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර ද හඳුනාගන්නා බැවින්, මෙම ඇගයීම් ක්‍රියාවලිය, සාමාජික රටවල් සඳහා ජාතික වශයෙන් වැදගත්වේ. එසේම, එමගින් සෑම රටක්ම සමානකොට සැළකෙන අතරම ගෝලීය වශයෙන්, ස්ථාවර පදනමක් මත මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ පියවරයන් ක්‍රියාත්මක කිරීමට දිරි දීමක් ද සිදු කෙරේ.

ශ්‍රී ලංකාව 2025 වසරේ දී සිය තෙවන අන්‍යෝන්‍ය ඇගයීම සඳහා මුහුණ දීමට නියමිතය. අන්‍යෝන්‍ය ඇගයීම් ද්විත්වයකට භාජනය වූ ශ්‍රී ලංකාවේ අතීත අත්දැකීම් එනම්, මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් අළු ලැයිස්තුගත කිරීම සහ එමගින් ඇති වූ ආර්ථික හා මූල්‍ය ප්‍රතිවිපාකයන්ට අනුව, ඉදිරි අන්‍යෝන්‍ය ඇගයීම රටෙහි ආර්ථික සහ මූල්‍ය ප්‍රගමනය සඳහා අතිශය වැදගත් වනු ඇත.

### 2. අන්‍යෝන්‍ය ඇගයීම් ක්‍රියාවලිය

අන්‍යෝන්‍ය ඇගයීම් ක්‍රියාවලියේදී, ජාත්‍යන්තර ඇගයුම්කරුවන් විසින් රටක මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ පද්ධතිය පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් සිදු කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය මාස 14-18ක පමණ කාලයක් පුරා පවත්වනු ලබන අතර එහිදී, තාක්ෂණික අනුකූලතාව සහ ඵලදායීතාව යන ප්‍රධාන සංරචක ද්විත්වය අගයනු ලැබේ.

- **තාක්ෂණික අනුකූලතාව:** නීති රාමුව සහ එහි බලාත්මකභාවය, නිසි බලධාරීන්ගේ අධිකාරීත්වයේ පැවැත්ම, බලතල සහ ක්‍රියාපටිපාටි ද ඇතුළුව මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ වල ඇතුළත් නිශ්චිත අවශ්‍යතාවන් ක්‍රියාත්මක කිරීම.
- **ඵලදායීතාව තක්සේරු කිරීම:** ඵලදායීතාව යනු, මූල්‍ය පද්ධතීන් සහ ආර්ථිකයන් විසින් මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට සහ සමූල ඝාතක අවි ව්‍යාප්තිය සඳහා මුදල් සැපයීම හා සම්බන්ධ අවදානම් සහ තර්ජන අවම කරනු ලබන ප්‍රමාණය යි. මෙය, (අ) යම් ප්‍රතිපත්තියක, නීතියක හෝ බලාත්මක කිරීමක; (ආ) නීතිය බලාත්මක කිරීමේ වැඩසටහනක, අධීක්ෂණයක හෝ බුද්ධිමය ක්‍රියාකාරකමක; හෝ (ඇ) නිශ්චිත පියවර මාලාවක් ක්‍රියාත්මක කිරීමක, අපේක්ෂිත ප්‍රතිඵලයක් විය හැක.

තාක්ෂණික අනුකූලතාව සහ ඵලදායීතාව තක්සේරු කරනු ලබන අන්‍යෝන්‍ය ඇගයීම් ක්‍රියාවලියේ අදියරයන් පිළිවෙලින් පහත පරිදි වේ.

i. **තාක්ෂණික අනුකූලතාව තක්සේරු කිරීම (මාස 4):** රටක්, එහි නීති සහ රෙගුලාසි පිළිබඳ තොරතුරු සැපයීම.

ii. **විෂය පථය තීරණය කිරීම:** ඵලදායීතාව තක්සේරු කිරීම සහ ස්ථානීය පරීක්ෂාවන්හිදී අවධානය යොමු කළ යුතු කරුණු නිර්ණය කිරීම සඳහා මූලිකවම විෂය පථය තීරණය කිරීමක් සිදු වේ.

iii. **ස්ථානීය පරීක්ෂාව (සති 2):** තක්සේරුකරුවන් ස්ථානීය පරීක්ෂාව සඳහා අදාල රට වෙත යාම.

2

iv. **වාර්තාව කෙටුම්පත් කිරීම:** ස්ථානීය පරීක්ෂාවෙන් පසු, තක්සේරුකරුවන් විසින් තාක්ෂණික අනුකූලතාව සහ ඵලදායීතා තක්සේරුව පිළිබඳ සොයාගැනීම් ඇතුළත් කර ඇගයීම් වාර්තාව සකස් කිරීම.

v. **මූල්‍ය කාර්ය සාධක බලකා සැසි වාරය (තාක්ෂණික අනුකූලතා තක්සේරුවෙන් මාස 15කට පසු):** සෑම වසරකම පවත්වනු ලබන මූල්‍ය කාර්ය සාධක බලකා සැසි වාර ත්‍රිත්වයෙන් එක් සැසි වාරයක දී තක්සේරුකරුවන් විසින් කෙටුම්පත් වාර්තාව ඉදිරිපත් කිරීම.

vi. **අවසන් තත්ත්ව සමාලෝචනය (මූල්‍ය කාර්ය සාධක බලකා සැසි වාරයේ අනුමැතියෙන් මාස 2කට පසු):** මූල්‍ය කාර්ය සාධක බලකා සැසි වාරයේදී අනුමැතිය ලබාගත් පසු, වෙබ් අඩවියේ ප්‍රකාශයට පත්කිරීමට පෙර තාක්ෂණික ගුණාත්මකභාව සහ අනුරූපීතාව සහතික කිරීම සඳහා කෙටුම්පත් වාර්තාව සමාලෝචනය කිරීම.

vii. **පසු විපරම:** අදාල රටවල් විසින් ඉහත සඳහන් වාර්තාවේ ඉදිරිපත් කර ඇති අඩුපාඩු නිවැරදි කිරීමට අවශ්‍ය වන අතර එය මීළඟ අන්‍යෝන්‍ය ඇගයීම දක්වා වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ.

**3. අන්‍යෝන්‍ය ඇගයීමෙහි ඇති ජාතික වැදගත්කම**

රටක ආරක්ෂිත හා ශක්තිමත් මූල්‍ය පද්ධතියක පැවැත්ම සහතික කිරීම සඳහා අන්‍යෝන්‍ය ඇගයීම් ක්‍රියාවලිය තුළින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව සහ ඵලදායීව ක්‍රියාත්මක කරන්නේ ද යන්න පිළිබඳ මූලික වශයෙන් අවධානය යොමු කෙරේ. ඒ අනුව, අන්‍යෝන්‍ය ඇගයීම් ක්‍රියාවලියේ දී සතුටුදායක ප්‍රතිපලයක් ලබා ගැනීම මගින්, ගෝලීය මූල්‍ය පද්ධතිය තුළ රටෙහි තත්ත්වය ආරක්ෂා කරගත හැකි අතර එමගින් ආර්ථික වර්ධනය වේගවත් කිරීම මෙන්ම සුරක්ෂිත මූල්‍ය පද්ධතියක පැවැත්ම ද සහතික කරයි.

අන්‍යෝන්‍ය ඇගයීමෙහි ජාතික වැදගත්කම පෙන්නුම් කරන සාධක කිහිපයක් පහත දැක්වේ.

i. **මූල්‍ය ස්ථායීතාව ආරක්ෂා කිරීම:** මූල්‍ය පද්ධතියේ ඒකාග්‍රතාව සහ ස්ථායීතාව ආරක්ෂා කිරීම සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ඵලදායී පියවරයන් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශයන්ට අනුගත වීමෙන්, අනුරූපි බැංකු සේවා සහ ප්‍රාග්ධන වෙළඳපොල ප්‍රවේශයට අහිතකර ලෙස බලපානු ලබන පරිදි අධි අවදානම් සහිත රටක් වීමේ හැකියාව අවම කරනු ලබයි.

ii. **ජාතික ආරක්ෂාව ඉහළ නැංවීම:** ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ වෙනත් සාපරාධී ක්‍රියාකාරකම් සඳහා නීති විරෝධී අරමුදල් භාවිතා කිරීම වැළැක්වීම මගින් ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ශක්තිමත් පාලන තන්ත්‍රයක් අත්‍යවශ්‍ය වේ. අන්‍යෝන්‍ය ඇගයීම්වලට භාජනය වීමෙන් සහ එයින් හඳුනාගත් දුර්වලතා නිවැරදි කිරීමෙන්, රටවල් නීති විරෝධී මූල්‍ය ප්‍රවාහයන් අවහිර කිරීමට ඔවුන් සතු හැකියාව ශක්තිමත් කරන අතර එමගින් රටේ ජාතික ආරක්ෂාවද සහතික කරයි.

iii. **ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම:** මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගත වීම සඳහා තම කැපවීම ප්‍රදර්ශනය කිරීමට අන්‍යෝන්‍ය ඇගයීම් ක්‍රියාවලිය සඳහා රටවල සහභාගීත්වය ඉතා වැදගත් වේ. මෙම ප්‍රමිතීන් පවත්වා ගැනීම තුළින් ගෝලීය හවුල්කරුවන් සහ ආයෝජකයන් අතර විශ්වාසය ප්‍රවර්ධනය වන අතරම ගෝලීය මූල්‍ය ප්‍රජාව අතර රටක කීර්තිය ද වර්ධනය වේ.

iv. **ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා පහසුකම් සැලසීම:** මූල්‍ය අපරාධ සාර්ථකව මැඩලීම සඳහා ඉහළ ජාත්‍යන්තර සහයෝගීතාව සහ තොරතුරු හුවමාරු කර ගැනීම, අන්‍යෝන්‍ය ඇගයීම් ක්‍රියාවලිය තුළින් ප්‍රවර්ධනය කරයි. මූල්‍ය කාර්ය සාධක බලකායේ ප්‍රමිතීන්ට අනුකූල වීම තුළින් ගෝලීය මූල්‍ය පද්ධතිය තුළ රටක ස්ථාවරත්වය වැඩි දියුණු කිරීමට හේතුවන අතර එමගින් විමර්ශන සහ නීතිය බලාත්මක කිරීමේ ක්‍රියාවන්හිදී අනෙකුත් රටවල් සමග සහයෝගීතාව කාර්යක්ෂම කිරීමට පහසුකම් සැලසීම සිදු කරයි. මෙම සහයෝගීතාව, මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිව සටන් කිරීම සඳහා ගෝලීය වශයෙන් සිදු කෙරෙන සාමූහික ප්‍රයත්නයන් ශක්තිමත් කරන අතර එමගින් මූල්‍ය අපරාධ වැළැක්වීම ද ඵලදායී ලෙස සිදු කළ හැක.

v. **දුර්වලතා හඳුනාගැනීම:** අන්‍යෝන්‍ය ඇගයීම් මගින් රටවල් වලට ඔවුන්ගේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුවල පවතින දුර්වලතා සහ ඌණතා හඳුනා ගැනීමට හැකි වේ. එසේම මෙමගින් අපරාධකරුවන් විසින් සිදු කරනු ලබන සූරාකෑම වැළැක්වීම සහ ගනු ලබන පියවරයන්හි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා තීරණාත්මක වන නීතිමය හෝ බලාත්මක කිරීමේ දුර්වලතා පිළිබඳව මෙමගින් රටවල් දැනුවත් කිරීමක් ද සිදු වේ.

**4. අන්‍යෝන්‍ය ඇගයීම් වලට මුහුණ දීමේ ශ්‍රී ලංකාවේ අතීත අත්දැකීම්**

අසියා-ශාන්තිකර කලාපය සඳහා වන මූල්‍ය කාර්ය සාධක බලකා අනුරූපී නිරීක්ෂණ ආයතනය වන මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය

කණ්ඩායම විසින් පවත්වනු ලැබූ අන්‍යෝන්‍ය ඇගයීම් ද්විත්වයකට 2006 සහ 2014/15 කාලවකවානු තුළදී ශ්‍රී ලංකාව මුහුණ දී ඇත. මෙම ඇගයීම් දෙකෙහිම ප්‍රතිපලයක් ලෙස මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ශ්‍රී ලංකාව එහි මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව තුල පවතින ක්‍රමෝපායන්ගේ අඩුපාඩු සහිත රටක් ලෙස ලැයිස්තුගත කරන ලද අතර එය සාමාන්‍යයෙන් "අළු ලැයිස්තුගත කිරීම" ලෙස හඳුන්වනු ලබයි. මෙලෙස අවස්ථා දෙකෙහිදීම අළු ලැයිස්තුගත වීම අහිතකර ආර්ථික හා මූල්‍ය ප්‍රතිවිපාක ඇති කිරීමට හේතු විය.

2014/2015 වසරේ පැවැති දෙවන අන්‍යෝන්‍ය ඇගයීමෙන් පසු ශ්‍රී ලංකාව අළු ලැයිස්තුගත කිරීම හේතුවෙන්, 2018 පෙබරවාරි මාසයේදී යුරෝපා කොමිසම විසින් ද ශ්‍රී ලංකාව ක්‍රමෝපායික අඩුපාඩු ඇති, ඉහළ අවදානම් සහිත තුන්වන පාර්ශ්වයේ රටක් ලෙස ලැයිස්තුගත කළ අතර එය ශ්‍රී ලංකාවේ අනුරූපී බැංකු කටයුතු වලට ද අහිතකර බලපෑම් එල්ල කරන ලදී.

එසේ වුව ද, 2015 වසරෙන් පසු ශ්‍රී ලංකාව සිය මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ පද්ධතිය සැලකිය යුතු ලෙස වැඩි දියුණු කිරීමට පියවර ගත් බැවින්, 2019 ඔක්තෝබර් සහ 2020 මැයි යන කාලවකවානු වලදී මූල්‍ය කාර්ය සාධක බලකාය සහ යුරෝපා කොමිසම විසින් ශ්‍රී ලංකාව උක්ත ලැයිස්තුවලින් ඉවත් කරන ලදී.

**5. ඉදිරි අන්‍යෝන්‍ය ඇගයීම සඳහා ශ්‍රී ලංකාවේ සූදානම**

පසුගිය ඇගයීම් වල අහිතකර බලපෑම් සැලකිල්ලට ගනිමින්, රටේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ පාලන තන්ත්‍රය ශක්තිමත් කිරීම ඉදිරි අන්‍යෝන්‍ය ඇගයීම සඳහා අත්‍යවශ්‍ය වේ. මේ සඳහා ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයේ සම්බන්ධීකරණයෙන් රජය සහ නීති ක්‍රියාත්මක කරන ආයතන, මූල්‍ය ආයතන, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපර සහ වෘත්තීන් ඇතුළු පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්නයන් අවශ්‍ය වේ.

මෙම සන්දර්භය තුළ මූල්‍ය අපරාධ මැඩලීම සඳහා වන කැපවීම ප්‍රදර්ශනය කිරීම සඳහා රටේ සූදානම ඉතා වැදගත් වේ. මෙම ඇගයීම මගින් ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව පිළිබඳ පූර්ණ තක්සේරුවක් ලබා දෙන අතර, ශක්තීන්, දුර්වලතා සහ වැඩිදියුණු කල යුතු ක්ෂේත්‍ර ඉස්මතු කරයි. ඒ අනුව, අන්‍යෝන්‍ය ඇගයීමට සූදානම් වීම සඳහා ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් පියවර කිහිපයක් ගෙන ඇත.

i. **මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වූ කාර්ය සාධක බලකාය පිහිටුවීම:** හඳුනාගත් ඌණතා විසඳීමට සහ අදාල පාර්ශ්වකරුවන් අතර සම්බන්ධීකරණය පවත්වා ගැනීමට මෙන්ම ඔවුන්ගේ ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකුගේ ප්‍රධානත්වයෙන් පස් දෙනෙකුගෙන් සමන්විත කාර්ය සාධක බලකායක් පත් කරන ලදී.

ii. **ජාතික සම්බන්ධීකරණ කමිටුව සමග සහයෝගයෙන් කටයුතු කිරීම:** මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වූ ජාතික සම්බන්ධීකරණ කමිටුව යනු, ශ්‍රී ලංකාව තුළ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම හා සම්බන්ධ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේදී පාර්ශ්වකරුවන් අතර ජාතික මට්ටමේ සම්බන්ධීකරණය පවත්වාගෙන යන උපදේශක මණ්ඩලයකි. මෙම ජාතික සම්බන්ධීකරණ කමිටුව සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වූ කාර්ය සාධක බලකායේ නායකත්වයෙන් ඉදිරි අන්‍යෝන්‍ය ඇගයීම සඳහා අදාල සියලු කටයුතු සම්බන්ධීකරණය කෙරේ.

iii. **2021/22 දී ජාතික අවදානම් ඇගයීම පැවැත්වීම:** මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශයන්ට අනුකූලව, රට මුහුණ දෙන මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම සහ අවබෝධ කර ගැනීම සඳහා 2021/22 දී ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් දෙවන ජාතික අවදානම් තක්සේරුව සම්බන්ධීකරණය කරන ලදී. ඒ අනුව, රටේ සමස්ත මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම "මධ්‍යම" ලෙස තක්සේරු කරන ලද අතර එය "මධ්‍යම" මට්ටමේ වූ අදාල තර්ජනයන් සහ ඊට නතු වීමට ඇති ඉඩකඩ යන ද්විත්වයෙහි එකතුවකි.

iv. **2023-2028 කාලපරිච්ඡේදය සඳහා ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම:** රට තුළ පවතින මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිව ඵලදායී ලෙස සටන් කිරීම සඳහා ජාතික අවදානම් තක්සේරුව මත පදනම්ව එමඟින් හඳුනාගත් දුර්වලතා නිවැරදි කිරීමට, 2023-2028 කාලපරිච්ඡේදය සඳහා සකස් කරන ලද මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ ජාතික ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කිරීම.

v. **පාර්ශ්වකරුවන් සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම:** ඉදිරි අන්‍යෝන්‍ය ඇගයීම සඳහා ප්‍රධාන පාර්ශ්වකරුවන් සූදානම් කිරීමේ අරමුණින්, රටෙහි මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුවෙහි කාර්යක්ෂමතාවය සහ තාක්ෂණික අනුකූලතා මට්ටම වැඩි දියුණු කිරීමට අදාල පාර්ශ්වකරුවන් 24

2

2

දෙනෙකු සඳහා ක්‍රියාකාරී සැලසුම් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙම ක්‍රියාකාරී සැලසුම් පාර්ශ්වකරුවන් අතර බෙදා හරින ලද අතර ඔවුන් විසින් එහි ප්‍රගතිය නිරන්තරව ජාතික සම්බන්ධීකරණ කමිටුව සහ කාර්ය සාධක බලකාය වෙත ලබා දිය යුතු වේ.

vi. **ව්‍යවස්ථා සංශෝධන සිදු කිරීම:** මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ නෛතික රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගත වීම සහතික කිරීම සඳහා, 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත, 2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත ඇතුලුව ප්‍රධාන නීති සංශෝධනය කිරීමට ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය කටයුතු කරමින් සිටී. තවද 2007 අංක 07 දරන සමාගම් පනතේ සංශෝධන සඳහා ද ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් සහයෝගය දක්වනු ලැබේ. මෙම සංශෝධන 2024 වර්ෂයේ තුන්වන කාර්තුවට පෙර අවසන් කිරීමට නියමිතය.

**6. නිගමනය**

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම තක්සේරු කිරීම, ජාතික රාමුවල දුර්වලතා හඳුනා ගැනීම, ජාතික ආරක්ෂාව වැඩි දියුණු කිරීම, ජාත්‍යන්තර සහයෝගීතාවට පහසුකම් සැලසීම සහ මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරන බැවින් මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් සිදු කරනු ලබන අන්‍යෝන්‍ය ඇගයීම් සාමාජික රටවල් සඳහා ජාතික වශයෙන් වැදගත්කමක් සහිත අංගයක් ලෙස සැළකිය හැක. මෙම ක්‍රියාවලියට සක්‍රීයව සහභාගී වීමෙන්, රටවලට මූල්‍ය අපරාධ වලට එරෙහි ක්‍රියාමාර්ග ශක්තිමත් කළ හැකි අතර ආරක්ෂිත හා වඩාත් සුරක්ෂිත ගෝලීය මූල්‍ය පරිසරයකට දායක විය හැකිය. ඒ අනුව, සියලුම ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්නය මගින් ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව කාර්යක්ෂම හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇති අතර, ශ්‍රී ලංකාවට ඉදිරි අන්‍යෝන්‍ය ඇගයීමේදී වඩා හොඳ අනුකූලතා මට්ටමක් ළඟා කර ගැනීමටත්, ගෝලීය මූල්‍ය ප්‍රජාව තුළ ශ්‍රී ලංකාවේ ස්ථාවරය ශක්තිමත් කිරීමටත් හැකිවනු ඇත.


මූලාශ්‍ර

1. FATF (2012-2023), International Standards on Combating Money Laundering and the Financing of Terrorism & Proliferation, FATF, Paris, France, www.fatf-gafi.org/en/publications/Fatfrecommendations/Fatf-recommendations.html
2. FATF (2013-2023), Methodology for Assessing Compliance with the FATF Recommendations and the Effectiveness of AML/CFT Systems, updated June 2023, FATF, Paris, France, http://www.fatf-gafi.org/publications/mutualevaluations/documents/fatf-methodology.html
3. FATF (2021). What are FATF mutual evaluations?, https://www.fatf-gafi.org/content/dam/fatf-gafi/methodology/Handout-5th-Round-Methodology.pdf
4. Basel Institute on Governance (2023), Basel AML Index 2023: 12th Public Edition Ranking money laundering and terrorist financing risks around the world.


ශ්‍රී ලංකාව මුහුණ දෙන වඩාත්ම සැලකිය යුතු මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ තර්ජන, ඊට නතුවීමට ඇති ඉඩකඩ සහ අවදානම් ඉස්මතු කරයි. ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ සමස්ත අවදානම 'මධ්‍යම' අගයක පවතින බව එම ඇගයීම මගින් තක්සේරු කර ඇත. ජාතික අවදානම් ඇගයීමේ නිරීක්ෂණ මත පදනම්ව 2023-2028 සඳහා වූ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සකස් කරන ලද අතර, එය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. 2025 මාර්තු මාසයේ සිට ආරම්භ වීමට නියමිත මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව පිළිබඳ අන්‍යෝන්‍ය ඇගයීම සඳහා ප්‍රධාන පාර්ශ්වකරුවන් සූදානම් කිරීම අරමුණු කරගනිමින්, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ ජාතික රාමුවේ සඵලතාව සහ තාක්ෂණික අනුකූලතාව වැඩිදියුණු කිරීම අරමුණු කරගත් පාර්ශ්වකාර ආයතන විසිහතරක් සඳහා එක් එක් පාර්ශ්වකරුවන් අනුව වන ක්‍රියාකාරී සැලසුම් ද අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. එම ක්‍රියාකාරී සැලසුම්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය විසින් අදාළ පාර්ශ්වකරුවන් සමඟ පසු විපරම් රැස්වීම් මාලාවක් පවත්වන ලදී. එකී ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කිරීමට සහ අදාළ පාර්ශ්වකරුවන් ඵලදායී ලෙස සම්බන්ධීකරණය කරමින් හඳුනාගත් දුර්වලතා විස්තීර්ණ, කාලෝචිත හා ඵලදායී ලෙස විසඳීම සහතික කිරීම සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන කාර්ය සාධක බලකායක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලදී.

**2023 වසරේ දී මූල්‍ය බුද්ධි ඒකකය අවදානම් මත පදනම් වූ අධීක්ෂණයට අමතරව, සිය ඒකාබද්ධ අධීක්ෂණ ප්‍රතිපත්තිය අඛණ්ඩව ක්‍රියාත්මක කළේය.**

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ අධීක්ෂණ ක්‍රියාවලිය සහ ආයතනික අනුකූලතාව ශක්තිමත් කිරීම සඳහා, මූල්‍ය බුද්ධි ඒකකය විසින් බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, නිශ්චල දේපළ වෙළඳාම් ආයතන, බලපත්‍රලාභී රක්ෂණ සමාගම්, බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවන් සහ නීතිඥයින් හා නොතාරිස්වරුන් ඇතුළු වාර්තාකරණ ආයතන වෙත චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. තවද, වසර තුළ දී, අල්ලස් හෝ දූෂණය, සහ මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධ සැක කටයුතු ගනුදෙනු හඳුනා ගැනීම පිළිබඳ වූ අවදානම් දර්ශක ලැයිස්තු සහ රක්ෂණ අංශය, සුරැකුම්පත් අංශය, හා මුදල් හෝ වටිනාකම් හුවමාරු සේවා අංශය සඳහා වූ අවදානම් දර්ශක ලැයිස්තු 5ක් නිකුත් කරන ලදී.

### 2.4.8 මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්ති

**2023 වර්ෂය තුළ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීම සඳහා මූලික පියවර ගන්නා ලදී.** ඒ අනුව, එම වර්ෂය තුළ දී මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ රෙගුලාසි මූල්‍ය සේවා සපයන්නන් වෙත නිකුත් කරන ලදී. එමගින් මූල්‍ය අංශය තුළ විනිවිදභාවය, සාධාරණත්වය හා වගකීම් සහගත ව්‍යාපාරකරණය සම්බන්ධයෙන් ඉහළ අවධානයක් යොමුකර ඇති අතර, ඒ අනුව මූල්‍ය පාරිභෝගිකයින්ගේ ලැදියාවන් සහ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ කැපවීම පිළිබිඹු වේ. නියමිත ද්විස්ථර පැමිණිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටියට අමතරව, මෙම රෙගුලාසි හරහා ඵලදායී මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය තහවුරු කිරීම සඳහා අවශ්‍ය ඉතා වැදගත් යාන්ත්‍රණයක් වන වෙළඳපොළ හැසිරීම අධීක්ෂණ කටයුතු ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට අවශ්‍ය බලතල සපයා ඇත. ශ්‍රී ලංකාවේ මූල්‍ය පාරිභෝගිකයින්ගේ සුබසිද්ධියට ප්‍රමුඛත්වය ලබා දෙමින් මූල්‍ය පද්ධතියේ විශ්වසනීයත්වය හා ස්ථායීතාවය පවත්වාගෙන යාම සඳහා 2024 වර්ෂය තුළ මෙම මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව බලාපොරොත්තු වේ. මූල්‍ය පාරිභෝගිකයින්ගේ අයිතීන් සහ ලැදියාවන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය සහ මූල්‍ය සේවා සපයන්නන් අතර ආචාරධර්ම පිළිබඳ ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීමට අවධානය යොමු කරමින් 2024 වර්ෂයේ උපායමාර්ගික ප්‍රමුඛතාවයක් වශයෙන් වෙළඳපොළ හැසිරීම අධීක්ෂණය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි.

### 2.4.9 තැන්පතු රක්ෂණය සහ මූල්‍ය ආයතනවල නිරාකරණ පිළිබඳ ප්‍රතිපත්ති

**මහ බැංකු පනත විසින් බලපත්‍රලාභී මූල්‍ය ආයතනවල නිරාකරණ අධිකාරිය ලෙස මහ බැංකුව නම් කරනු ලැබීය.** 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත මගින්, මහ බැංකුවේ නිරාකරණය කිරීමේ අධිකාරී බලය නිර්වචනය කරන අතර, බලපත්‍රලාභී මූල්‍ය ආයතනයක් කාලීනව නිරාකරණය කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග නියම කිරීම; මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කරමින් එවැනි බැංකුවක තැන්පත්කරුවන්ගේ සහ ණයහිමියන්ගේ යහපත සහතික කිරීම සඳහා එකී බැංකුව අඛණ්ඩ පැවැත්මක් සහිතව යළි පණගැන්වීම පිණිස සහ තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයක් සහ ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලියක් සඳහා විධිවිධාන සැලැස්වීම ද සිදු කෙරේ. බැංකු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට සහ නිරාකරණය කිරීමේ ක්‍රියාවලිය උදෙසා අවශ්‍ය කටයුතු සූදානම් කිරීමේ ක්‍රියාමාර්ග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආරම්භ කරන ලදී. නිරාකරණ අත්පොතක් පිළියෙළ කිරීම, නිරාකරණ ප්‍රේරක පිහිටුවීම, බලපත්‍රලාභී මූල්‍ය ආයතන සඳහා දත්ත ගබඩාවක් නිර්මාණය කිරීම සහ 2023 වසරේ දී නිරාකරණ ක්‍රියාවලිය සැලසුම් කිරීම සඳහා දත්ත සටහන් සැකසීම මෙම පියවරයන්ට ඇතුළත් වේ. මෙම පියවර මගින් අවසාන වශයෙන් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරනුයේ ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල වීම, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව තහවුරු කිරීම මෙන්ම ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී මූල්‍ය ආයතන නිරාකරණය කිරීම සඳහා සැලසුම් සකස් කිරීමට පහසුකම් සැලසීමයි.

**මහ බැංකු පනත සහ බැංකු (විශේෂ විධිවිධාන) පනත මගින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිහිටුවීම, මහජන විශ්වාසය තහවුරු කිරීම ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ප්‍රවර්ධනය කිරීම සහ දායකත්වය වැඩි කිරීමට ඇති ඉඩ හඳුනාගෙන ඇත.** ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පරිපාලනය සහ කළමනාකරණය කිරීම සඳහා මෙහෙයුම් ක්‍රියා පටිපාටි බැංකු (විශේෂ විධිවිධාන) පනත මගින් ප්‍රකාශ කරන අතර, තැන්පතු රක්ෂණ අරමුදලට අදාළ බලතල, රාජකාරි සහ කාර්යයන් ද නියම කර ඇත. රජයේ සහ ලෝක බැංකුවේ සහයෝගීතාවයෙන් ආරම්භ කරන ලද මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි මූල්‍ය සහ ආයතනික හැකියාවන් ශක්තිමත් කිරීමට දායක වෙයි.

මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ, ලෝක බැංකුව විසින් පිරිනමනු ලබන මූල්‍යන ක්‍රමවේදයක් හරහා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය ශක්තිමත් කරන ලද අතර රජය සමග අරමුදල් සැපයීමේ විධිවිධාන ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආයෝජන කළඹ දේශීය සහ ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළ තුළ උපකරණ පරාසයක් හරහා පුළුල් කිරීම සඳහා නව ආයෝජන ප්‍රතිපත්තියක් කෙටුම්පත් කරමින් පවතී. මෙම ප්‍රතිපත්ති මත පදනම් වූ වැඩිදියුණු කිරීම් හරහා ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කරමින් තැන්පතු රක්ෂණකරුවන්ගේ ජාත්‍යන්තර සංගමය විසින් දක්වා ඇති මූලික තැන්පතු රක්ෂණ මූලධර්මවලට අනුකූලව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය ශක්තිමත් කිරීම අරමුණු කරයි.

### 2.4.10 මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ

**ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමට සමගාමීව මූල්‍ය පද්ධතියේ ව්‍යුහාත්මක දුර්වලතාවලට පිළියම් යෙදීම, ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා මූල්‍ය අංශය බහුපාර්ශ්වික ආයතන සමග සහයෝගීතාවයෙන් සැලකිය යුතු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයන්ට භාජනය වෙමින් පවතී.** වසර තුළ දී දේශීය බැංකු වත්කම්වලින් සියයට 90ක් නියෝජනය කරන දේශීය බැංකු නවයක් සඳහා වන ස්වාධීන වත්කම්වල ගුණාත්මක බව පිළිබඳ සමාලෝචන සංරචක විමර්ශන ක්‍රියාවලිය අවසන් කරන ලදී. මෙම වත්කම්වල ගුණාත්මක බව සමාලෝචනයේ විෂය පථය තුළ රුපියල් ණය සහ අත්තිකාරම්, විදේශ මුදල් ණය, අත්තිකාරම් සහ විදේශ මුදලින් නාමනය කරන ලද මූල්‍ය උපකරණ ඇතුළත් විය. වත්කම් තත්ත්ව සමාලෝචනට යටත්ව, විශාල බැංකු පහක් සඳහා බැංකු පද්ධති ප්‍රාග්ධනය සහ විදේශ මුදල් ද්‍රවශීලතා හිඟයන් පියවා ගැනීමට මහ බැංකුව විසින් මාර්ග සිතියමක් සකස් කරන ලදී. ඒ සඳහා වත්කම්වල ගුණාත්මක බව සමාලෝචනයේ ප්‍රතිඵල, ඉදිරි දැක්මක් සහිත ආතති පරීක්ෂාව සහ ස්වෛරී ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ අපේක්ෂිත බලපෑම ද සලකා බලන ලදී. වත්කම්වල ගුණාත්මක බව සමාලෝචනවලට යටත්ව අනෙකුත් බැංකු හතර සඳහා ද එවැනිම ක්‍රියාවලියක් සිදුවෙමින් පවතී. පෞද්ගලික මූලාශ්‍රවලින් ප්‍රාග්ධන හිඟය පියවා ගැනීමට නොහැකි වූ බැංකු සඳහා රජය විසින් ප්‍රාග්ධනීකරණය සඳහා උපාය මාර්ග සකස් කර ඇත. ඒ අනුව, බැංකු ක්ෂේත්‍රයේ ප්‍රාග්ධන වර්ධන ක්‍රියාවලියට සහාය වීම සඳහා 2024 අයවැය යටතේ රුපියල් බිලියන 450ක් වෙන් කර ඇත. තවද, 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන තවදුරටත් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම සඳහා සංශෝධන පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

**මූල්‍ය අංශයේ අර්බුද කළමනාකරණ කමිටුව සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ තාක්ෂණික කමිටුව ක්ෂේත්‍රයේ අර්බුදවලට පෙර සූදානම් කිරීමේ රාමු ශක්තිමත් කිරීම සඳහා පිහිටුවන ලදී.** අන්තර් ආයතන සම්බන්ධීකරණය සහ සන්නිවේදනය පහසු කිරීම සඳහා මෙම කමිටු, මහ බැංකුවේ සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් සමන්විත විය. මූල්‍ය ක්ෂේත්‍රයේ ඇති විය හැකි පද්ධතිමය අර්බුද හා එයින් මූර්ත ආර්ථිකයට ඇති බලපෑම් අධ්‍යනය කිරීම සහ මූල්‍ය ක්ෂේත්‍රයට සිදුවිය හැකි හානි අවම කිරීමේ වගකීම මෙම කමිටු වෙත පැවරී ඇත. මෙම කමිටු දෙක අදියර දෙකකින් ක්‍රියාත්මක වන අතර කමිටු පළමු අදියරේ දී නියාමනය කරන ලද මූල්‍ය ආයතනවල ද්‍රවශීලතා අවදානම් සහ ප්‍රාග්ධන මට්ටම් සමීපව අධීක්ෂණය කරනු ඇත. දෙවන අදියරේ දී, අර්බුද සඳහා පෙර සූදානම, අර්බුද කළමනාකරණය සහ මූල්‍ය අර්බුදයක බලපෑම අවම කිරීම සඳහා ස්ථිර රාමුවක් ස්ථාපිත කෙරෙනු ඇත.

### 2.4.11 අනෙකුත් ප්‍රතිපත්ති

**මූල්‍ය පද්ධතියේ ධනාත්මක සහ ඍණාත්මක ප්‍රවණතා සම්බන්ධයෙන් මහජනතාවගේ දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම උදෙසා වසර තුළ දී ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී.** ඩිජිටල් ගෙවීම් ක්‍රම සම්බන්ධයෙන් වූ පාරිභෝගික ගැටලු විසඳීම සඳහා මහ බැංකුව පූර්වෝපායික පියවර ගෙන ඇත. ගෙවීම් සේවා සම්බන්ධ අනාරක්ෂිත, නොගැළපෙන හෝ අසාධාරණ භාවිතයන් පිළිබඳව මහජනතාවගේ දැනුම්වත්භාවය ඇති කිරීම උදෙසා මහ බැංකුවේ වෙබ් අඩවියේ ත්‍රිභාෂා වෙබ් පෝරමයක් හඳුන්වා දී ඇත. මුදල් ප්‍රතිපත්තිය පිළිබඳව පමණක් නොව, වංචා සහ තහනම් මූල්‍ය යෝජනා ක්‍රම ඇතුළු මූල්‍ය පද්ධතිය හා සම්බන්ධ අත්‍යවශ්‍ය පණිවිඩ ඉක්මණින් බෙදා හැරීම සහතික කිරීම සඳහා සියලු ආකාරයේ සමාජ මාධ්‍යවල ද මහ බැංකුව ක්‍රියාකාරීව සිටියි.

**පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය වැඩි දියුණු කිරීම සඳහා වසර තුළ දී පියවර ගන්නා ලදී.** සියලුම ප්‍රචාරණ මාධ්‍යන්ගේ නියැලීම නිරීක්ෂණය කිරීමට අමතරව, දැනට පවතින උපාය මාර්ගවල සඵලතාවය

අඛණ්ඩව තක්සේරු කිරීම සඳහා සමීක්ෂණ කිහිපයක් සිදු කිරීම සහ හඳුනාගත් කණ්ඩායම් කීපයක් සමඟ සාකච්ඡා කිරීම ද සිදු කරන ලදී. මෙම අදහස් ලබා ගැනීමේ ක්‍රම වේදයන්, වැඩිදියුණු කළ යුතු අංශ හඳුනා ගැනීම, මහජන ආකල්ප මැනීම සහ වෙනස් වන අවශ්‍යතා සපුරාලීම පිණිස සන්නිවේදන උපායමාර්ග මනාව සකස් කිරීම සඳහා උපකාරී විය.

මූල්‍ය පද්ධති ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා විචක්ෂණශීලී සන්නිවේදන උපාය මාර්ග හරහා මූල්‍ය පද්ධතිය පිළිබඳ විශ්වාසය ගොඩනැගීම ඉතා වැදගත් වේ. ඉහත සඳහන් කළ ප්‍රයත්න සඳහා උපකාරී වීමට පුළුල් පරාසයක ප්‍රේක්ෂකයින් වෙත අධ්‍යාපනික වැඩසටහන් කිහිපයක් සිදු කරන ලදී.

2

## විශේෂාංග සටහන

## ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ ඊට අදාළ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග[1]

**මහ බැංකු කටයුතු**

| | |
|---|---|
| 2023 සැප්තැම්බර් 15 | ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම, මුදල් නීති පනත (422 වන අධිකාරිය) ඉවත් කිරීම, සහ ඒ හා සම්බන්ධ කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කරන ලදී. |
| 2023 ඔක්තෝබර් 03 | 2023 ඔක්තෝබර් මස 05 වැනි දින ගැසට් කරන ලද මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව අතර මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම මගින් මහ බැංකුව සඳහා උද්ධමන ඉලක්කයක් නියම කෙරුණු අතර, මහ බැංකුව විසින් කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ කාර්තුමය මතුපිට උද්ධමන අනුපාතිකය සියයට 5ක මට්ටමේ පවත්වාගෙන යාම අවශ්‍ය වේ. |

**මුදල් ප්‍රතිපත්තිය**

| | |
|---|---|
| 2023 ජනවාරි 02 | 2023 ජනවාරි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සඳහා නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගත හැකි උපරිම වාර ගණන දින දර්ශිත මසකට උපරිම අවස්ථා පහක් (05) දක්වා සීමා කරන ලද අතර, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සඳහා නිත්‍ය ණය පහසුකම ලබාගැනීම ඕනෑම එක් දිනක් සඳහා අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයෙන් සියයට 90ක් දක්වා සීමා කෙරිණි. |
| 2023 මාර්තු 03 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, සියයට 15.50ක් සහ සියයට 16.50ක් දක්වා ඉහළ නංවන ලදී. |
| 2023 ජූනි 01 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 250කින්, පිළිවෙළින්, සියයට 13.00ක් සහ සියයට 14.00ක් දක්වා අඩු කරන ලදී. |
| 2023 ජූලි 06 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 200කින්, පිළිවෙළින්, සියයට 11.00ක් සහ සියයට 12.00ක් දක්වා අඩු කරන ලදී. |
| 2023 අගෝස්තු 09 | 2023 අගෝස්තු 16 වැනි දිනෙන් ආරම්භ වන සංචිත පවත්වා ගෙන යෑමේ කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 2.00ක් දක්වා ප්‍රතිශතාංක 2.00කින් අඩු කරන ලදී. |
| 2023 ඔක්තෝබර් 05 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, සියයට 10.00ක් සහ සියයට 11.00ක් දක්වා අඩු කරන ලදී. |
| 2023 නොවැම්බර් 24 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, සියයට 9.00ක් සහ සියයට 10.00ක් දක්වා අඩු කරන ලදී. |

1 2023 ජනවාරි 01 සිට 2024 මාර්තු 28 දක්වා වන කාලය තුළ දී ක්‍රියාත්මක කරන ලද සහ නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඇතුළත් වේ.

2023 ජනවාරි 01 සිට 2024 මාර්තු 28 දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ එයට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ එම කාලය තුළ දී ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සවිස්තරාත්මක අනුවාදයක් මාර්ගගතව ලබා ගත හැක.

යොමුව : ප්‍රධාන මෙනුව → ප්‍රකාශන → ආර්ථික සහ මූල්‍ය වාර්තා → වාර්ෂික ආර්ථික විවරණය → වාර්ෂික ආර්ථික විවරණය 2023 → ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග

සබැඳිය : https://www.cbsl.gov.lk/si/ප්‍රකාශන/ආර්ථිකහාමූල්‍යවාර්තා/වාර්ෂිකආර්ථිකවිවරණය/වාර්ෂිකආර්ථිකවිවරණය2023/ප්‍රධාන ආර්ථිකප්‍රතිපත්තිමයක්‍රියාමාර්ග

| | |
|---|---|
| 2024 පෙබරවාරි 09 | 2024 පෙබරවාරි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, නිත්‍ය ණය පහසුකම මත පනවා තිබූ සීමාව ඉවත් කෙරුණු අතර, නිත්‍ය තැන්පතු පහසුකම මත පනවා තිබූ සීමාව දින දර්ශිත මාසයක් තුළ පස් වතාවක (05) සිට දස වතාවක් (10) දක්වා ලිහිල් කරන ලදී. |
| 2024 මාර්තු 26 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, සියයට 8.50ක් සහ සියයට 9.50ක් දක්වා අඩු කරන ලදී.<br><br>2024 අප්‍රේල් මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම සඳහා පැවැති සීමාව ඉවත් කරන ලදී. |
| **විශේෂ ණය යෝජනා ක්‍රම** | |
| 2023 සැප්තැම්බර් 15 | 2023 අංක 16 දරන නව මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද සෞභාග්‍ය ණය යෝජනා ක්‍රමයේ සහ දේශීය කෘෂිකාර්මික නියමු ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු අවසන් කරන ලදී. |
| 2024 ජනවාරි 03 | ඉදිරියේ දී රජයේ අරමුදල් මගින් හෝ අරමුදල් සපයනු ලබන නියෝජිත ආයතනවල අරමුදල් භාවිතයෙන් ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක නොකිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී. නමුදු දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ණය යෝජනා ක්‍රමයන්හි මෙහෙයුම් කාලය අවසන් වනතෙක් එම ණය යෝජනා ක්‍රම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කටයුතු කරනු ඇත. |
| **ගෙවීම් සහ පියවීම්** | |
| 2023 පෙබරවාරි 01 | ලංකාපේ ආයතනය (LankaPay (Pvt) Ltd), චීනයේ ස්ථාපිත සී/ස යුනියන්පේ ඉන්ටනැෂනල් සමාගම (UnionPay International Co.Ltd/UPI), සහ ඉන්දියාවේ ස්ථාපිත සී/ස NPCI ඉන්ටනැෂනල් පේමන්ට්ස් සමාගම (NPCI International Payments Ltd /NIPL) සමඟ සම්බන්ධ වී ශ්‍රී ලංකාව තුළ දී LANKAQR ක්‍රමය හරහා චීන සහ ඉන්දියානු ජාතිකයින්ට ඔවුන්ගේ ගෙවීම් පසුම්බිවලින් ගෙවීම් සිදු කිරීමට පහසුකම් සලසා දෙන ලදී. චීන සංචාරකයින් හට 2023 පෙබරවාරි මස සිට මෙම ක්‍රමය හරහා ගනුදෙනු කිරීමට හැකියාව ලැබුණු අතර ඉන්දියානු සංචාරකයින් හට 2024 පෙබරවාරි 12 වැනි දින සිට මෙම හැකියාව ලැබුණි. |
| 2023 මැයි 08 | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාත්‍යන්තර සේවා සපයන්නන් හරහා ක්‍රියාත්මක වන LANKAQR ගනුදෙනු සඳහා ගනුදෙනු මුදලින් උපරිම සියයට 1.8ක තනි වෙළඳ වට්ටම් අනුපාතිකයක් (MDR) හඳුන්වා දෙන ලදී. දේශීය LANKAQR ගනුදෙනු සඳහා සියයට 0.5ක් වෙළඳ වට්ටම් අනුපාතිකය එලෙසම පවත්වාගෙන යන ලදී. |
| 2023 අගෝස්තු 31 | ගෙවීම් පිළිවෙත් සහ සේවා සම්බන්ධ අනාරක්ෂිත, අසත්‍ය හෝ අසාධාරණ භාවිතයන් පිළිබඳව මහජනතාවගෙන් තොරතුරු එක්රැස් කිරීම සඳහා ත්‍රෛභාෂා වෙබ් පිටුවක් හඳුන්වා දෙන ලදී. |

2

| | |
|---|---|
| 2023 දෙසැම්බර් 29 | ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව, ඍජු හර සේවාව, ඔබගේ ගනුදෙනුකරු හඳුනාගැනීම සඳහා වන හවුල් යාන්ත්‍රණය සහ රජයේ ඩිජිටල් ගෙවීම් වේදිකාව වැනි විවිධ ඩිජිටල් ගනුදෙනු මාධ්‍යයන් සඳහා සහභාගී වීම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවලට අනිවාර්ය කරන ලදී. එයට අමතරව, ගනුදෙනුකරුවෙකුගේ ණය සහ හර ගනුදෙනු සඳහා තත්කාලීන දැනුම් දීම් සක්‍රීය කිරීම, ග්‍රාමීය ප්‍රදේශවල ඩිජිටල් ගනුදෙනු ප්‍රචලිත කිරීම, ඩිජිටල් මාධ්‍යයන් හරහා සිදු කෙරෙන ණය කාඩ්පත් පියවීම් එසැණින් යාවත්කාලීන කිරීම සහ ඩිජිටල් ගනුදෙනුවක් සිදු කිරීමේ දී ප්‍රතිලාභියා වෙත යැවෙන විස්තරය අනිවාර්ය කිරීම වැනි ප්‍රමුඛතාවයන් බලපත්‍රලාභී බැංකුවලට අනිවාර්ය කරන ලදී. මූල්‍ය අත්පත්කරුවන් ලෙස ක්‍රියාකරන බලපත්‍රලාභී බැංකුවලට වෙළඳ වට්ටම් අනුපාතය ඔවුන්ගේ වෙළඳුන් විසින් ගනුදෙනුකරුවන්ගෙන් අය කර නොගන්නා ලෙස උපදෙස් දෙන ලෙස ද දැනුම් දෙන ලදී.<br>විද්‍යුත් මුදල් පසුම්බි හරහා සිදු කෙරෙන ඩිජිටල් ගනුදෙනු සමග විදේශ ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීමට වැඩි දියුණු කරන ලද (enhanced) සහ මූලික (basic) විද්‍යුත් මුදල් පසුම්බියක රුපියල් 50,000 සහ රුපියල් 10,000 යන සීමාවන්, පිළිවෙලින්, රුපියල් 150,000 සහ රුපියල් 20,000 දක්වා 2024 ජනවාරි 01 වැනි දින සිට ඉහළ දමන ලදී. |
| 2024 ජනවාරි 17 | 2024 අප්‍රේල් 01 දින සිට ගනුදෙනුවක වටිනාකම රුපියල් 10,000ට සමාන හෝ ඊට වැඩි නම්, ජස්ට්පේ ජංගම ගෙවීම් යෙදුම භාවිත කිරීමේ දී අදාළ මූල්‍ය ආයතනයෙන් එක් වරක් පමණක් භාවිත කළ හැකි මුරපදයක් (OTP) ඉල්ලා සිටීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනිවාර්ය කරන ලදී. ජස්ට්පේ පහසුකම සහිත ජංගම ගෙවීම් යෙදුම මගින් පරිශීලකයාට ඕනෑම මූල්‍ය ආයතනයක ඇති ඔහුගේ ගිණුමක් ජංගම ගෙවීම් යෙදුමට සම්බන්ධ කිරීමට සහ එවැනි ගිණුම්වලින් අරමුදල් ලබාගැනීමෙන් ගෙවීම් සිදු කිරීමට හැකියාව ලබා දෙයි. |
| 2024 පෙබරවාරි 01 | NEPALPAY QR ජංගම යෙදුම හරහා නේපාල සංචාරකයින් සිදු කරන LANKAQR ගනුදෙනු පිළිගැනීම සඳහා ලංකාපේ පුද්ගලික ආයතනයට නේපාල නිෂ්කාශන ආයතනය හා සම්බන්ධ වීමට අනුමැතිය ලබාදෙන ලදී. |

**මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම**

| | |
|---|---|
| 2023 මාර්තු 03 | අනුකූලතා අඩුපාඩු පිළිබඳ නිසි සුපරීක්ෂාවෙන් කටයුතු කරන ලෙස දැනුම්වත් කිරීම සඳහා සියලු බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වෙත 2023 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2023 ජූනි 07 | 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ නිශ්චල දේපළ වෙළඳාම් අංශය සඳහා වන ආයතනික අනුකූලතාව පිළිබඳව නිශ්චල දේපළ වෙළඳාම් ආයතන වෙත 2023 අංක 02 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2023 ජූනි 13 | මූල්‍ය බුද්ධි ඒකකයේ goAML පද්ධතිය වෙත දේශීයව සිදුවන විද්‍යුත් මුදල් ප්‍රේෂණ ගනුදෙනු වාර්තා කිරීම පිළිබඳ 2023 අංක 01 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී. |
| 2023 අගෝස්තු 07 | 2023 - 2028 අතර වසර 5ක කාලයකට අදාළව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. |
| 2023 සැප්තැම්බර් 01 | මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් නීතීඥවරුන් සහ නොතාරිස්වරුන් සඳහා වන අනුකූලතාවය පිළිබඳ 2023 අංක 02 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී. |

**විදේශ විනිමය කළමනාකරණය සහ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු**

| | |
|---|---|
| 2023 ජනවාරි 26 | "අභ්‍යන්තර ආයෝජන හුවමාරු ගිවිසුම් - IIS යෝජනා ක්‍රමය" වෙනුවෙන් නිකුත් කළ මෙහෙයුම් උපදෙස් අවලංගු කිරීම. |

| | |
|---|---|
| | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලබන එ.ජ.ඩො./ ශ්‍රී.ලං.රු. ගැනුම්-විකිණුම් සහ විකිණුම්-ගැනුම්, විදේශ විනිමය හුවමාරු ගිවිසුම් වෙන්දේසි සඳහා අදාළ වන මෙහෙයුම් උපදෙස් සියලුම බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කිරීම. |
| 2023 පෙබරවාරි 24 | 2023 පෙබරවාරි 27 දින සිට බලපැවැත්වෙන පරිදි දේශීය විදේශ විනිමය වෙළඳපොළ මත පදනම් වූ විදේශ විනිමය කටයුතු දිරිමත් කිරීම සඳහා, බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සතිපතා අනිවාර්යයෙන් විකිණීමට අවශ්‍යව තිබූ රුපියල්වලට පරිවර්තනය කෙරෙන සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, පරිවර්තනය කෙරෙන සේවා අපනයන ලැබීම්/ ආදායම් සහ අනිවාර්ය පදනම යටතේ පරිවර්තනය කරන ලද අපනයන ලැබීම්වලින් සියයට විසිපහක (25%) ප්‍රමාණය සියයට පහළොවක් (15%) දක්වා අඩුකිරීම. |
| 2023 පෙබරවාරි 27 | "විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් - ආයෝජිත" විවෘත කර පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙඳුන් වෙත අවසර ලබා දෙමින් 2023 අංක 01 දරන විධානය නිකුත් කරන ලදි. |
| 2023 මාර්තු 03 | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත 2022 මැයි 12 දින නිකුත් කරන ලද "විනිමය අනුපාතිකයේ දෛනිකව සිදුවන විචලනය කළමනාකරණය කිරීම", ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත 2021 ජනවාරි 27 දින නිකුත් කරන ලදුව, 2021 පෙබරවාරි 18 දින සංශෝධනය කරන ලද "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරිදීමනා යෝජනා ක්‍රමය" සහ "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" පිළිබඳ වූ මෙහෙයුම් උපදෙස් 2023 මාර්තු 07 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කිරීම. |
| 2023 ජූනි 28 | ඉදිරි මාස 06ක් දක්වා බලපැවැත්වෙන පරිදි, තෝරා ගත් ප්‍රාග්ධන ගනුදෙනුවලට අදාළ ප්‍රතිමුඛ ප්‍රේෂණ අත් හිටුවීම/සීමා කිරීම සඳහා 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 22 වගන්තිය යටතේ, 2023 ජූනි 28 දිනැති අංක 2338/40 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කරන ලදී. |
| 2023 දෙසැම්බර් 04 | මුදල් පනතේ - 2019 වාණිජ කේන්ද්‍රස්ථාන නියෝග අංක 01 ප්‍රකාරව දේශීය වෙළඳපොළට භාණ්ඩ/නිෂ්පාදන අලෙවි කිරීමට අවසර දී ඇති ව්‍යවසායකයින් ඇතුළත් කරමින් ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම්වලට අදාළව 2023 අංක 02 දරන විධානයන් නිකුත් කරන ලදී. |
| | මුදල් පනතේ - 2019 වාණිජ කේන්ද්‍රස්ථාන නියෝග අංක 01 ප්‍රකාරව දේශීය වෙළෙඳපොළට භාණ්ඩ/ නිෂ්පාදන අලෙවි කිරීමට අවසර දී ඇති ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කටයුතුවල නියැලී සිටින ව්‍යවසායකයින්ට ගෙවීම් කිරීමට ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම්වලට අදාළව 2023 අංක 03 දරන විධානයන් නිකුත් කරන ලදී. |
| 2023 දෙසැම්බර් 20 | ඉදිරි මාස හය සඳහා කලින් නිකුත් කරන ලද නියෝග මගින් ඇතැම් ප්‍රාග්ධන සහ ජංගම ගනුදෙනු සඳහා පනවා තිබූ අත් හිටුවීම්/ සීමා කිරීම් ක්‍රමයෙන් ලිහිල් කිරීම සඳහා 22 වැනි වගන්තිය යටතේ, 2023 දෙසැම්බර් 20 දින අංක 2363/26 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී. |
| 2024 ජනවාරි 01 | ජංගම ගනුදෙනු සඳහා පහසුකම් සැපයීම සඳහා වන " විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම- ආයෝජිත " විධානයන්හි වලංගු කාලය 2024 ජූනි 30 දක්වා දීර්ඝ කරමින් 2024 අංක 01 දරන විධානයන් නිකුත් කරන ලදී. |
| **රාජ්‍ය ණය කළමනාකරණය** | |
| 2023 පෙබරවාරි 13 | සෘජු නිකුතු කවුළුව ඔස්සේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ඉදිරිපත් කිරීම (Offering) අත්හිටුවන ලදී. |
| 2023 මාර්තු 16 | "2023 අංක 1 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (තොරතුරු හෙළිදරව් කිරීම) නියෝග" නිකුත් කරන ලදී. |

2

| | |
|---|---|
| 2023 අප්‍රේල් 04 | භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ දෙවන අදියර විවෘතව පවතින කාලසීමාව තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීම සිදු වන අවස්ථාවල දී, අදාළ භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ දෙවන අදියර, එම භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය අවසන් වූ වහාම පැයක කාලයක් සඳහා හෝ එම වෙන්දේසි දිනයේ ව්‍යාපාර කටයුතු අවසානය දක්වා යන අවස්ථා දෙකෙන් දීර්ඝතම අවස්ථාව දක්වා විවෘතව තබනු ලැබේ. |
| 2023 මැයි 12 | 1923 අංක 08 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත ප්‍රකාරව, භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම සඳහා පවතින සීමාව රුපියල් බිලියන 5,000 සිට රුපියල් බිලියන 6,000 දක්වා ඉහළ නැංවීමට කරන ලද යෝජනාව පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. |
| 2023 ජූනි 19 | 2023 ජූනි 19 වැනි දින අදාළ විධාන ප්‍රකාශයට පත් කිරීමත් සමඟ, අන්තර්ජාලය මත පදනම් වූ නව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ පද්ධතිය 2023 ජූනි 21 වැනි දින සිට ක්‍රියාත්මක කරන ලදී. |
| 2023 ජූලි 04 | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වී ඇති ණය තිරසරභාවය පිළිබඳ ඉලක්ක සපුරා ගැනීම සඳහා, විස්තීර්ණ ණය පහසුකමට අනුකූලව, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ දේශීය ණය ප්‍රශස්තකරණය (Domestic Debt Optimisation-DDO) පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කරන ලදී. |
| 2023 අගෝස්තු 21 | 2022 අංක 43 දරන විසර්ජන පනතේ 2(1)(ආ) වගන්තියේ දක්වා තිබූ රුපියල් බිලියන 4,979ක් වූ රජයේ ණය ගැනීමේ උපරිම සීමාව, රුපියල් බිලියන 13,979ක් ලෙස සංශෝධනය කිරීම සඳහා වන විසර්ජන (සංශෝධිත) කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. |
| 2023 සැප්තැම්බර් 14 | දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ හුවමාරු යෝජනාවට අනුව, භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුව පියවීම සිදු කරන ලදී. පිළිගන්නා ලද භාණ්ඩාගාර බැඳුම්කර, දිගු කල්පිරීම් සහිත රුපියල් බිලියන 3,204.5ක් වූ නව බැඳුම්කර බවට පරිවර්තනය කරන ලදී. තවද, ආයෝජකයින්ට ඔවුන්ගේ පිළිගන්නා ලද භාණ්ඩාගාර බැඳුම්කර සඳහා රුපියල් බිලියන 110.9ක උපචිත පොලියක් ගෙවන ලදී. |
| 2023 සැප්තැම්බර් 20 | භාණ්ඩාගාර බැඳුම්කර සඳහා අන්තර්ජාලය මත පදනම් වූ සෘජු නිකුතු කවුළුවක් 2023 සැප්තැම්බර් 25 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරන ලදී. |
| 2023 සැප්තැම්බර් 21 | 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ අංක 129(2) වගන්තියට අනුව සහ 2023 අංක 12 දරන විසර්ජන පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයට දුන් නොපියවූ තාවකාලික අත්තිකාරම් රුපියල් බිලියන 344.7ක් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළඳපොළෙන් මිලදී ගත් නොපියවූ භාණ්ඩාගාර බිල්පත් රුපියල් බිලියන 2,368.4ක් අතුරින් රුපියල් බිලියන 2,492.3ක්, ක්‍රමයෙන් අඩුවන ස්ථාවර කූපන් පොලියකින් යුතු නව භාණ්ඩාගාර බැඳුම්කර 10ක් බවට සහ රුපියල් බිලියන 220.8ක් එවකට වෙළඳපොළෙහි පැවති භාණ්ඩාගාර බිල්පත් 12ක් බවට 2023 සැප්තැම්බර් මස 21 දින පරිවර්තනය කරන ලදී. |
| 2023 නොවැම්බර් 03 | 2023 අගෝස්තු 18 වැනි දින අත්සන් කරන ලද මහජන බැංකුවේ අක්වෙරළ බැංකු ඒකක ණය ශේෂය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වූ අවබෝධතා ගිවිසුමට අනුව, දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ අක්වෙරළ බැංකු ඒකක ණය හුවමාරුව එම බැංකුව සඳහා ක්‍රියාත්මක කරන ලදී. එම ණය මුදල වන රුපියල් බිලියන 27.7 වෙනුවෙන් දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර 5ක් වෙන් කරන ලදී. |

2

| | |
|---|---|
| 2024 මාර්තු 11 | 2024 මාර්තු 07 දින අදාළ සංශෝධිත විධාන ප්‍රකාශයට පත් කිරීමත් සමග භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවල දෙවන අදියර සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රමාණය, වෙන්දේසියේ සමස්ත හිගය හා වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ සමස්ත වටිනාකමින් සියයට 10ක් හෝ රුපියල් බිලියන 5ක් යන ද්විත්වයෙන් ඉහළ අගයක් ගන්නා ප්‍රමාණය ලෙස අඩු කරන ලද අතර, 2024 මාර්තු 11 වැනි දින සිට මෙම විධානය බලාත්මක කරන ලදී.<br>2024 මාර්තු 07 වැනි දින අදාළ සංශෝධිත විධාන ප්‍රකාශයට පත් කිරීමත් සමග භාණ්ඩාගාර බැඳුම්කරවල ඍජු නිකුතු කවුළුව සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රමාණය, පළමු අදියරේ දී සම්පූර්ණයෙන් ම පිළිගනු ලබන සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංක සඳහා ඉදිරිපත් කළ මුදලින් සියයට 10ක් දක්වා අඩු කරන ලද අතර, 2024 මාර්තු 11 දින සිට මෙම විධානය බලාත්මක කරන ලදී. |

**මූල්‍ය අංශය**

**බලපත්‍රලාභී බැංකු**

| | |
|---|---|
| 2023 ජනවාරි 02 | 2023 ජනවාරි මස 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, බැංකු අනුපාතිකය මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කර ඇති නවතම බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය මත පදනම් අංක +300 ආන්තිකයක් එකතු කොට තීරණය කරනු ලබන බවට දන්වමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2023 ජනවාරි 31 | බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල (බලපත්‍රලාභී බැංකුවල) ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය ගණනය කිරීමේ දී, සුදුසුකම් ලත් මූල්‍ය නොවන සාංගමික ණය සුරැකුම්පත් සහ සුදුසුකම් ලත් මූල්‍ය නොවන සාමාන්‍ය කොටස් යන උපකරණ බැංකු පනත යටතේ නිකුත් කර ඇති බාසල් III ද්‍රවශීලතා ආවරණ අනුපාතය සඳහා වන විධානවල කොන්දේසිවලට යටත්ව ද්‍රවශීල වත්කම් ලෙස සැලකීමට අවසර ලබා දෙමින් බැංකු පනත් නිර්ණයක් නිකුත් කරන ලදී. |
| 2023 පෙබරවාරි 02 | පවත්නා සාර්ව ආර්ථික තත්ත්වයන් සහ බලපත්‍රලාභී බැංකුවල තිරසාර බව සහතික කිරීම සඳහා සුදුසු මට්ටමේ ද්‍රවශීලතාවක් සහ ප්‍රාග්ධනයක් පවත්වා ගැනීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම් සීමා කරමින් බැංකු පනත යටතේ විධාන නිකුත් කරන ලදී. |
| 2023 පෙබරවාරි 16 | 2022 මැයි 19 දිනැති නියෝගය මගින් ආවරණය වන දැනට පවතින සංයෝජිත වර්ගීකරණ කේත ලැයිස්තුවට අමතරව, අලුතින් එකතු කරන ලද සංයෝජිත වර්ගීකරණ කේත 64ක් සඳහා ණයවර ලිපි මත සියයට 100ක මුදල් ආන්තික තැන්පතු අවශ්‍යතාවක් පවත්වා ගැනීම සඳහා සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නියෝගයක් නිකුත් කරන ලදී. |
| 2023 පෙබරවාරි 17 | නව සංයෝජිත වර්ගීකරණ අංක 64ක් සඳහා 2022 අංක 03 දරන ආනයනවලට එරෙහිව ආන්තික අවශ්‍යතා යන බැංකු පනත් විධානයෙහි විධිවිධාන අදාළ කරමින්, එම බැංකු පනත් විධානය සඳහා සංශෝධනයක් නිකුත් කරන ලදී. |
| 2023 මාර්තු 07 | තම ව්‍යාපාර/ආදායම් මාර්ග පුනර්ජීවනය කිරීමට විභවතාවක් ඇති ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සහ පුද්ගලයන් දිරිමත් කිරීමේ අරමුණින් බලපෑමට ලක් වූ ණය ගනුදෙණුකරුවන් වෙත අවස්ථානුකූලව සුදුසු සහන සලසන ලෙස බලපත්‍රලාභී බැංකු වෙතින් ඉල්ලා සිටින ලදී. |
| 2023 අප්‍රේල් 21 | බලපත්‍රලාභී බැංකුවලට අදාළ නියාමන කටයුතු සඳහා සුදුසුකම් ලත් පිළිගත හැකි ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයක් ලෙස අයි.සී.ආර්.ඒ. ලංකා ලිමිටඩ් ආයතනය පිළිගැනීම අත්හිටුවන ලෙස දන්වමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |

2

| | |
|---|---|
| 2023 අප්‍රේල් 25 | බලපත්‍රලාභී බැංකුවල අභිමතානුරූපී ගෙවීම් සීමා කිරීම පිළිබඳ 2023 අංක 01 දරන බැංකු පනත් විධානයට සංශෝධනයක් නිකුත් කරන ලදී. ඒ අනුව, බලපත්‍රලාභී බැංකු විසින් විධානයේ දක්වන ලද අවශ්‍යතා සපුරාලීමෙන් තොරව ප්‍රධාන විධායක නිලධාරීන් සහ ප්‍රධාන කළමණාකරණ නිලධාරීන් සඳහා වන කළමණාකරණ දීමනා සහ අධ්‍යක්ෂක මණ්ඩල ගෙවීම් ඉහළ දැමීමෙන් වැළකිය යුතු වේ. |
| 2023 මැයි 17 | ණයවර ලිපි මත මුදල් තැන්පතු පවත්වාගෙන යෑම පිළිබඳව 2022 මැයි මස 19 සහ 2023 පෙබරවාරි මස 16 දින නිකුත් කරනු ලැබූ නියෝග අහෝසි කරන ලදී. |
| 2023 මැයි 18 | ආනයනවලට එරෙහි ආන්තික අවශ්‍යතා සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2022 අංක 03 දරන බැංකු පනත් විධානය සහ 2023 අංක 02 දරන බැංකු පනත් විධානය අවලංගු කරමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |
| 2023 අගෝස්තු 25 | බලපත්‍රලාභී බැංකුවල ඇතැම් ශ්‍රී ලංකා රුපියල් ණය සඳහා උපරිම පොලී අනුපාත පනවමින් සහ අනෙකුත් සියලුම නව සහ පවතින රුපියල් ණයවල පොලී අනුපාත ඉලක්කගත දිනයන්හි දී නිශ්චිත ප්‍රතිශතවලින් අඩු කරන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත නියෝග කරමින් ශ්‍රී ලංකා රුපියල් ණය සඳහා වන පොලී අනුපාත යන මැයෙන් මුදල් නීති පනත් නියෝගයක් නිකුත් කරන ලදී. |
| 2023 නොවැම්බර් 15 | 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත, පාර්ලිමේන්තුව විසින් 2023 සැප්තැම්බර් 14 දින සහතික කරන ලද අතර, අංක 2358/46 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගය අනුව, ඉහත සඳහන් පනතේ විධිවිධාන 2023 නොවැම්බර් 15 සිට ක්‍රියාත්මක විය.<br><br>2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 2023 අංක 01 දරන නියෝගයන් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජික ආයතන වෙත නිකුත් කරන ලදී. |
| 2023 නොවැම්බර් 23 | 2024 සහ 2025 වසර සඳහා අදාළ වන නව බලපත්‍ර ගාස්තු ව්‍යුහය දන්වමින් වාර්ෂික බලපත්‍ර ගාස්තු පිළිබඳ බැංකු පනත් නිර්ණයක් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |
| 2023 නොවැම්බර් 27 | 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිකුත් කරන ලද නිර්ණයන් අංක 2360/02 ගැසට් නිවේදනය යටතේ සාමාන්‍ය ජනතාව වෙත නිකුත් කරන ලදී. |
| 2023 දෙසැම්බර් 08 | පසුගිය කාලය තුළ පැවති අසාමාන්‍ය තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් අනුකූලවීමේ පොදු කාලසීමාවන් සහ ඇතැම් අනුකූලවීම් සඳහා වන සුවිශේෂ කාලසීමාවන් දීර්ඝ කරමින් බලපත්‍රලාභී බැංකු සඳහා තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා වන නියාමන රාමුව සම්බන්ධයෙන් වූ 2021 අංක 16 දරන බැංකු පනත් විධානය සඳහා සංශෝධන නිකුත් කරන ලදී. |
| 2024 පෙබරවාරි 29 | ප්‍රයිස්වෝටර්හවුස්කූපර් සහ එස් ජේ එම් එස් ඇසෝසියේට්ස් යන විගණන ආයතනවල නම් වෙනස් කිරීමත් සමඟ එම විගණන ආයතනවල නම්, පිළිවෙලින්, ඩෙලොයිට් පාර්ට්නර්ස් සහ ඩෙලොයිට් ඇසෝසියේට්ස් ලෙස වෙනස් කරමින්, 2019 අංක 08 දරන "බලපත්‍රලාභි වාණිජ බැංකු සහ බලපත්‍රලාභි විශේෂිත බැංකුවල ගිණුම් ප්‍රකාශ විගණනය කිරීම සඳහා සුදුසුකම් ලත් විගණකයින්ගේ ලැයිස්තුව" යන චක්‍රලේඛයට සංශෝධන නිකුත් කරන ලදී. |
| 2024 මාර්තු 25 | ණය සංකේන්ද්‍රණ අවදානම අවම කරමින් බැංකු ක්ෂේත්‍රයේ සුරක්ෂිතතාව සහ ශක්තිමත්භාවය තහවුරු කිරීමේ අරමුණින්, 2026 ජනවාරි 01 දින සිට බලාත්මක කිරීමට නියමිතව, "බලපත්‍රලාභී බැංකුවල විශාල ගනුදෙනු නිරාවරණයවීම්" පිළිබඳ බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |

| | |
|---|---|
| 2024 මාර්තු 28 | සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට පත් ව්‍යාපාර තිරසාර ලෙස යළි නඟා සිටුවීමට පහසුකම් සැලසීමේ අරමුණින් සහ බලපත්‍රලාභී බැංකුවල වත්කම්වල ගුණාත්මක බව ඉහළ නැංවීමේ අරමුණින් "බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම සඳහා වන මාර්ගෝපදේශ" පිළිබඳ චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | බැංකු (සංශෝධන) පනත<br>ආයතනික යහපාලනය පිළිබඳ සංශෝධිත විධාන |

**බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්**

| | |
|---|---|
| 2023 ජනවාරි 05 | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන විමර්ශන කටයුතු තවදුරටත් සිදු කරගෙන යාමේ අරමුණින්, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද නියෝගයන්ට අනුව, පර්පෙචුවල් ට්‍රෂරීස් ලිමිටඩ් විසින් ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම, 2023 ජනවාරි 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මාස හයක කාලසීමාවක් සඳහා තවදුරටත් දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. |
| 2023 ජනවාරි 18 | ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතනයක් ලෙස ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී වෙත නිකුත් කර තිබූ ලියාපදිංචි කිරීම, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතෙහි 9.1. (ඇ) වගන්තිය ප්‍රකාරව අවලංගු කරන ලදී. |
| 2023 ජනවාරි 31 | බැංකු නොවන මූල්‍ය ආයතන අංශය ඒකාබද්ධ කිරීමේ සැලැස්මේ (ඒකාබද්ධකරණ වැඩපිළිවෙල) කොටසක් ලෙස එල්ඕඑල්සී ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී සමාගම, එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී සමඟ ඒකාබද්ධ වීමෙන් පසු, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් එල්ඕඑල්සී ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී සමාගමට මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත (මුදල් ව්‍යාපාර පනත) යටතේ නිකුත් කර තිබූ බලපත්‍රය අවලංගු කරන ලදී. තවද, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත (කල්බදු මූල්‍යකරණ පනත) යටතේ එල්ඕඑල්සී ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී වෙත නිකුත් කර තිබූ ලියාපදිංචි කිරීම බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් අවලංගු කරන ලදී.<br><br>ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වා ගැනීම තුළින් අවිනිශ්චිත කාල වකවානු තුළ ඇති විය හැකි ආර්ථික කම්පන අවශෝෂණය සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම්වල ඔරොත්තු දීමේ හැකියාව සහ ධාරිතාව ශක්තිමත් කිරීමේ පියවරක් වශයෙන් සහ ගනුදෙනුකරුවන්ගේ ණය අවශ්‍යතා සඳහා අඛණ්ඩව සහාය වීම සඳහා, ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම හෝ ලාභ රටින් බැහැර කිරීම පිළිබඳ මාර්ගෝපදේශය බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කරන ලදී. |
| 2023 පෙබරවාරි 02 | නිශ්චිත කාර්යයන් සඳහා පිළිගත් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් ලෙස ක්‍රියා කිරීමෙන් ඉක්රා ලංකා ලිමිටඩ් ආයතනය ඉවත් කර ඇති බව බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත දැනුම් දෙන ලදී. |
| 2023 පෙබරවාරි 08 | ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් ව්‍යාපාර පනත යටතේ 2018 ජූලි 25 වැනි දින බලපත්‍රය අවලංගු කරන ලද ද ස්ටෑන්ඩඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් වෙත අධිකරණයේ අධීක්ෂණයට යටත්ව, ඈවරකරුවෙකු පත් කිරීමට කොළඹ වාණිජ මහාධිකරණය විසින් නියෝග කරන ලදී. |
| 2023 මාර්තු 03 | පවතින සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සහ පුද්ගලයන් සඳහා සුදුසු සහන ලබා දෙන ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම වෙතින් ඉල්ලා සිටින ලදී. |

2

| | |
|---|---|
| 2023 මාර්තු 21 | ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් ව්‍යාපාර පනත යටතේ 2020 මැයි 22 වැනි දින බලපත්‍රය අවලංගු කරන ලද ද ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ් වෙත අධිකරණයේ අධීක්ෂණයට යටත්ව, ඈවරකරුවෙකු පත් කිරීමට කොළඹ වාණිජ මහාධිකරණය විසින් නියෝග කරන ලදී. |
| 2023 අප්‍රේල් 25 | 2023 අප්‍රේල් 25 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් ව්‍යාපාර පනතේ 37 (1) වගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කිරීමේ නිවේදනයක් බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී සමාගමට නිකුත් කරන ලදී. |
| 2023 ජූනි 09 | ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් ව්‍යාපාර පනත යටතේ 2018 මාර්තු 05 වැනි දින බලපත්‍රය අවලංගු කරන ලද සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් ලිමිටඩ් වෙත අධිකරණයේ අධීක්ෂණයට යටත්ව, ඈවරකරුවෙකු පත් කිරීමට කොළඹ වාණිජ මහාධිකරණය විසින් නියෝග කරන ලදී. |
| 2023 ජූලි 05 | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන විමර්ශන කටයුතු තවදුරටත් සිදු කරගෙන යාමේ අරමුණින්, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද නියෝගයන්ට අනුව, පර්පෙචුවල් ට්‍රෂෙරීස් ලිමිටඩ් විසින් ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම, 2023 ජූලි 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මාස හයක කාලසීමාවක් සඳහා තවදුරටත් දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. |
| 2023 ජූලි 31 | ඒකාබද්ධකරණ වැඩපිළිවෙලෙහි කොටසක් ලෙස, 2023 ජූලි 31 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී සමඟ ඒකාබද්ධ වී ඇති අතර එම ඒකාබද්ධ වීමෙන් අනතුරුව පවතින ආයතනය නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී වේ. |
| 2023 සැප්තැම්බර් 01 | බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය මුහුණ දී තිබූ බරපතල තත්ත්වය මගහරවා ගනිමින් සෑහීමකට පත්විය හැකි ප්‍රගතියක් පෙන්වීමට අපොහොසත් වීම හේතුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නියම කරන ලද පරිදි 2023 සැප්තැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි එම ආයතනය වෙත නිකුත් කරන ලද මුදල් ව්‍යාපාර බලපත්‍රය අවලංගු කරන ලදී. |
| 2023 දෙසැම්බර් 15 | මුදල් ව්‍යාපාර පනත යටතේ ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයට, අධිකරණයේ අධීක්ෂණයට යටත්ව ඈවරකරුවෙකු පත් කිරීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණය විසින් නියෝග කරන ලදී. |
| 2024 ජනවාරි 05 | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන විමර්ශන කටයුතු තවදුරටත් සිදු කරගෙන යාමේ අරමුණින්, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද නියෝගයන්ට අනුව, පර්පෙචුවල් ට්‍රෂෙරීස් ලිමිටඩ් විසින් ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම, 2024 ජනවාරි 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මාස හයක කාලසීමාවක් සඳහා තවදුරටත් දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් තීරණය කරන ලදී. |
| 2024 පෙබරවාරි 13 | බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල ව්‍යාපාර සහ ආයතනික කටයුතු සිදු කරන ආකාරය පිළිබඳව දැනගැනීම සඳහා හෝ වෙනත් නිශ්චිත අරමුණක් සඳහා බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල කාලෝචිත, නිවැරදි, ස්ථාවර සහ සම්පූර්ණ තොරතුරු ලබා ගැනීමේ අරමුණ ඇතිව කාලානුරූප වාර්තාකරණ අවශ්‍යතා පිළිබඳව උපදෙස් නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | කුඩා සහ මධ්‍ය පරිමාණයේ බලපත්‍රලාභී මුදල් සමාගම්වල දිගු කාලීන තිරසරභාවය තහවුරු කිරීම සඳහා වන ඒකාබද්ධ කිරීමේ සැලැස්මේ II වන අදියර ක්‍රියාත්මක කිරීම. |

මුදල් ව්‍යාපාර පනතට සහ කල්බදු මුල්‍යකරණ පනතට සිදු කරන සංශෝධන ඇතුළුව, වර්තමාන වෙළඳපොළ ප්‍රවණතා සමඟ අනුකූලවන පරිදි පවත්නා නියාමන රාමුව සංශෝධනය කිරීම.

අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලිය ශක්තිමත් කරන අතරතුර බැංකු නොවන මූල්‍ය ආයතන අංශයෙහි ස්ථායීභාවය වැඩිදියුණු කිරීමට අදාළ නීති සහ රෙගුලාසි හඳුන්වා දීම.

**මූල්‍ය අංශයට අදාළ වෙනත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග**

| | |
|---|---|
| 2023 අගෝස්තු 08 | මූල්‍ය සේවා සපයන්නන් විසින් සාධාරණ, විනිවිදභාවයෙන් යුතු සහ සදාචාරාත්මක ව්‍යාපාර පවත්වාගෙන යාම ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන වෙළඳපොළ අධීක්ෂණය සහ බලගැන්වීම් සිදු කිරීමට අවශ්‍ය පදනම සැපයීම සඳහා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය සේවා සපයන්නන් හට අදාළ වන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි 1949 අංක 58 දරන මුදල් නීති පනතේ (MLA) 10 (ඇ) වගන්තිය යටතේ නිකුත් කරන ලදී. |
| 2024 ජනවාරි 31<br>2024 පෙබරවාරි 01<br>2024 පෙබරවාරි 06 | ලෝක බැංකුවේ මූල්‍ය අංශයේ සුරක්ෂිතතා ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ලෝක බැංකු සමූහයේ සාමාජික ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර ණය ගිවිසුම් අත්සන් කරන ලදී. |